*Vidyodaya J., Soc. Sc. Vol. 1 No. 1 January 1987 pp. 27 - 45*

# ඇතා සහ ස්වස්තික කාසිය

ටී. ජී. කුලතුංග

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය.

අනුරපුර මුල් අවදියේදී ශ්‍රී ලංකාවේ භාවිතාවූ කාසි අතරින් දැනට වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇති කාසියක් හැටියට බෞද්ධ ස්වස්තික හෝ ඇතා හා ස්වස්තික නමින් හැඳින් වෙන කාසිය දැක්විය හැකිය. මේ වර්ගයේ කාසියක් පළමුවරට තිස්සමහාරාමයෙන් සොයාගත් හෙන්රි පාකර් මහතා ඒ පිළිබඳ විස්තරයක් 1884 වර්ෂයේ රාජකීය ආසියාතික සමිති (ලංකා ශාඛාව) සඟරාවට සැපයීය. ඉන්පසුව මිහින්තලේ පූලියන්කුලම ඉරනයිමඩු මාන්තොට, වල්ලිපුරම් අනුරාධපුරය ආදී ස්ථානවලින්ද වත්මන් පුරාවිද්‍ය කැණීම් කෙරෙන අනුරාධපුර දඹුල්ල මාන්තෙයි ආදී ස්ථාන වලින්ද මේ කාසි වර්ගය හමුවී ඇත.1

මේ කාසියේ අභිමුඛයේ ඇති වඩාත් කැපී පෙනෙන රූප සටහන් වලට අනුව මෙය ඇතා සහ ස්වස්තික කාසිය ලෙස එච්. ඩබ්. කොඩ්රින්ටන් මහතා විසින් නම් කර ඇත.2 ''කණු සතරක් පිරිවර කොට ඇති කණුවක් මත පිහිටීමෙන් පාරිශුද්ධත්වයක් පෙනෙන නිසා'' මෙහි දැක්වෙන රූප සටහන් වලට බෞද්ධ අර්ථකථනයක් දීමෙන් මෙය බෞද්ධ ස්වස්තික කාසිය වශයෙන් හැඳින්වීමට එච්. සී. පී. බෙල්3, ලීලානන්ද කල්දේරා4, ඩී. පී. ඊ. හෙට්ටිආරච්චි5, මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි6 ආදී වියත්තු පෙළඹෙති.

එහෙත් මේ කාසිය භාවිතයේ පැවති සමාජයේදී එය කුමන නාමයකින් හැඳින්වීදැයි පිළිබඳව ස්ථිර යමක් කීමට පැහැදිලි සාධක හමු නොවෙතත් පැරණි සිංහල බරමිනුම් ක්‍රම හා සසඳමින් මෙය මෙරට පැරණි මූලාශ්‍රවල සඳහන් ''හුණ'' විය යුතු බවට කොඩ්රින්ටන් මහතා අදහසක් ඉදිරිපත් කොට ඇත.7 දහවැනි සියවසට අයත් පළමුවැනි උදය රජුගේ ලිපියක ''පස් හුණක් රන් දී'' යැයි සඳහන් වන අතර8 දහතුන්වැනි සියවසට අයත් මයූරපාද පරිවේනාධිපතින් වහන්සේගේ යෝගාර්ණවයේ සිංහල බර මිනුම් ක්‍රම පිළිබඳව දක්වද්දී ''විසි මදටෙක් කළදෙක්, තුන් කළදෙක් හුණෙක්9 ආදී වශයෙන් මදටිය 60 ක බර හුනක් වන බව දක්වා ඇත. මදටියක (මංචාඩි) සාමාන්‍ය බර ප්‍රමාණය ග්‍රෙන්ස් 4.3 ලෙස ගනිමින් පැරණි හුන'' ග්‍රෙන්ස් 60 x 4.3 -258 ක් පමණ වියයුතු බව කොඩ්රින්ටන් මහතා දක්වයි.10 ලංකාවේ විවිධ ප්‍රදේශ

---

1. Codrington, H.W. Ceylon Coins & Currency1924 – Ceylon, p. 20
   සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ අනුරපුර, දඹුල්ල ප්‍රදර්ශන කවුළු හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මාන්තෙයි කැණීම් වලින් ලැබුණ කෝට්ටෙ පුරාවිද්‍යා අංශයේ ඇති පුරාවස්තු.
2. Codrington, H. W. op-cit.
3. Bell, H.C.P. ASCAR 1900, p. 6.
4. කල්දේරා, ලීලානන්ද, ලංකාවේ මිල මුදල්, කොළඹ 1959, 7 පිට.
5. Hettiaratchi D. P. E., "The Symbols on the Buddhist Swastika Coins of Ancient Ceylon" Paranavitana Felicitation Volume, 1965. p. 227
6. විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ, ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය. කොළඹ 1969 පිටු 12–14
7. Codrington. H. W. op. cit p. 26
8. ibid p. 194
9. ibid p. 190
10. ibid p. 8-11

වලින් හමුවී ඇති මෙම කාසි ගෙවීයාම, කැඩීයාම හෝ අවශේෂ බැඳීම නිසා විවිධ බර ප්‍රමාණයන්ගෙන් යුක්ත වුවද මධ්‍යස්ථ වශයෙන් ගත් කල්හි මෙය ග්‍රෙන්ස් 250 සිට තරමක් ඉහළ බර ප්‍රමාණයකට වැටේ.[1]

විශ්කම්භය දළ වශයෙන් අඟල් එකහමාරක් පමණැති රවුම් තඹ කාසියක් වන මෙහි කාලය නිර්ණය කිරීමේදී මේ කාසිය සමඟ හමුවූ අනෙකුත් පුරාවස්තු, කාසියේ දක්නට ලැබෙන සලකුණු හා විදේශීය කාසි යනාදිය නාණක විශාරදයින් විසින් උපයෝගී කරගෙන ඇත. භාරතයේ භාවිතයේ පැවති ඉතා පැරණි කාසි විශේෂයක් වන කුනිද කාසි හා සසඳමින් මෙය ක්‍රිස්තු පූර්ව අවධියට වැටෙන බව කොඩ්රින්ටන් මහතා දක්වා ඇත.[2] මෙය ක්‍රිස්තු පූර්ව පළමුවැනි සියවසේ සිට හය වැනි සියවස දක්වා මෙරට භාවිතයේ පැවැති කාසියක් හැටියට ලීලානන්ද කල්දේරා මහතා දක්වා ඇත.[3] ලංකාවේ ප්‍රථමයෙන්ම භාවිතාවූ ලෝහ කාසි වර්ගය භාරතයේ නිෂ්පාදිත එසේම එරටෙහි භාවිතයේ පැවති ධරණ (කහාපණ හෝ පුරාණ) බව අද අවිවාදයෙන් පිළිගන්නකි. භාරතයේ මෙම කාසි භාවිතය ක්‍රි. පූ. 4 -- 3 සියවස් අතරට වැටේ. ප්‍රථමයෙන්ම භාරතයෙන් ආනයන කළා වුවද දෙවනුව මේ වර්ගයේ කාසි ලංකාවේද නිෂ්පාදනය කළ බවට පැහැදිලි සාධක වනුයේ 1984 අනුරපුර ගෙඩිගේ කැණීම් වලින් හමුවී ඇති කාසි අච්චුය.[4] ස්වස්තික කාසියේ නිමාව දෙස බලන විට තාක්ෂණික අංශයෙන් ඉහත කී ධරණ කාසියට වඩා දියුණු තත්ත්වයක් පෙන්නුම් කිරීම අනුවද එය ධරණ කාසියට වඩා පසු කාලයක නිෂ්පාදනය වූ බව පැහැදිලි වේ. ඒ අනුව මෙම කාසියේ නිෂ්පාදනය ක්‍රිස්තු පූර්ව තුන්වැනි ශතකයට මෙහා මිස එහා වීමට නොහැකිය. කාසියේ ඇති සංකේත ඇසුරින් කාලය නිගමනය කිරීමට යාමේදී මෙහි දක්වෙන බ්‍රාහ්මී නොවන සංකේත බ්‍රාහ්මී අක්ෂර භාවිතයට පෙර මෙරට භාවිතයේ පැවති බවටත් පරණවිතාන ශූරීන් දක්වා ඇති මතය[5] අනුව කාසියේ නිෂ්පාදන වකවානුව අප දක්වූ කාලසීමාවට වඩා ඈතට ගෙන යාමට නොහැකිය. කාසියේ සඳහන් බ්‍රාහ්මී නොවන සංකේතය වූ ස්වස්තිකය හා සමාන සළකුණු මෙරට බ්‍රාහ්මී සෙල්ලිපි අතර ක්‍රිස්තු පූර්ව පළමුවැනි හා දෙවැනි ශතකයන්ට සීමාවී ඇති හෙයින්[6] මෙම සළකුණු එක්තරා කාල සීමාවකදී පමණක් ව්‍යවහාරයේ පැවැතිණැයි සැළකුව හොත් මෙම කාසියද ඉහත කී බ්‍රාහ්මී සෙල්ලිපි අයත් වන්නා වූ කාල වකවානුවට දැමීම අසීරු නොවේ. එසේම මෙම කාසි බොහොමයක සළකුණු මුද්‍රණය කිරීමේදී ඇති වෙනස්කම් කෙරේ. සුපරීක්ෂාකාරී වන කල්හි මේවා අවස්ථා කීපයකදීම විවිධ අච්චුවල මුද්‍රණය කළ බවක් සිතීමට අනුබලයක් ලැබේ. මේ අතර විශේෂයෙන්ම ඇත්රූපය, නන්දිපාද සළකුණ ත්‍රිරත්නය අංකුසය ආදියේ ඇති වෙනස්කම් ප්‍රධාන වශයෙන් දකින්නට ලැබේ. මේ කාසියේ නිෂ්පාදන වකවානුවට වඩා පසුකාලයේ යැයි සැළකෙන කාසි සමඟ එකට වරින් වර හමුවී තිබීම නිසා නිෂ්පාදන වකවානුවෙන් පසු අභාවයට නොගොස් ශතවර්ෂ කීපයක්ම භාවිතයේ පැවතෙන්නට ඇතිබව සිතීමට අවකාශ ලැබේ.

---

1. Codrington, H. W. op. cit p. 21
2. ibid p. 20
3. කල්දේරා ලීලානන්ද, ලංකාවේ මිල මුදල් 8 පිට
4. Ancient Ceylon No. 2, P. 150, pl. 2. c, d.
5. පරණවිතාන එස්. "සින්ධුලෝණ කියවීමට යෝජිත ක්‍රමයක්, ශ්‍රී සුමංගල 1962 අමරවංශ හිමි කොත්මලේ, ලක්දිව සෙල්ලිපි. 1969, කොළඹ, 24 පිට.
6. Paranavitana S., Brahmi Inscriptions of Ceylon, vol. 1. Epigraphia Zeilanica Vol. P. 229

කාසියේ අභිමුඛයේ මෙන්ම ප්‍රතිමුඛයේද ඇති සළකුණු සියල්ල රවුම් රේඛ වලින් වටවී ඇත. අභිමුඛයේ කාසිය වටේ එසේවූ රවුම් රේඛා දෙකක් වන අතර ඒ දෙක අතර පරතරය අඟල් 1/10 පමණ වේ. එම පරතරයේ රේඛාවලට සමාන්තරව කඩින් කඩ තිත් සහිතව දිවෙන තවත් රේඛාවකි. රේඛාවෙන් වටවූ අභිමුඛයේ ඇති සළකුණු ප්‍රමාණය හයකි. දැනට ප්‍රසිද්ධියට පත්ව ඇති ආකාරයට මෙවා ඇතා, වෘක්ෂය, බෞද්ධ ස්වස්තිකය, චෛත්‍යය, තුන්කොන් සළකුණ හා තිත් සළකුණ යනුවෙන් වර්ග කළ හැකිය. ප්‍රතිමුඛයේද එක් රේඛාවකින් පමණක් වටවූ ඈඳුම්මක අභිමුඛයේ ඇති ස්වස්තික ලකුණ, චෛත්‍යය, තුන්කොන් සටහන් දෙකක් එකට බැඳුණු සළකුණ, නන්දිපාදය, තවත් සමහරවිට අංකුසය සහ තිත් සළකුණ දකින්නට ලැබේ.1

මෙම සළකුණු පිළිබඳව නාණක විද්‍යාඥයින් හා පුරාවිද්‍යාඥයින් විසින් දැනට සපයා ඇති විවිධ අර්ථ කථන ඉහත කී කාසිය හඳුනාගැනීමට පමණක් නොව කිනම් අදහසක් මුල්කොට ගෙන මෙම සළකුණු යොදවේද යන්න අවබෝධ කර ගැනීමේදී අපට පිටු බලයක් වනු ඇත. මේ අතරින් වාඩත්ම වැදගත් වන්නේ අභිමුඛයේ මෙන්ම ප්‍රතිමුඛයේද විශාල ලෙස සටහන් කර ඇති රේක්කයක් හා සමාන සටහනකට ඈඳුණ ස්වස්තික සළකුණයි. මේ නිසා කොඩ්රින්ටන් මහතා එය රේක්කය සහිත ස්වස්තිකය යනුවෙන් හැඳින්වීමට කැමති වී ඇත.2 බොහෝ විද්වතුන් මෙය එක්තරා සංකේතයක් හැටියට සළකා අර්ථ කථනයක් දීමට උත්සාහ දරද්දී පරණවිතාන ශූරීන් මෙය අනුරපුර අවදියේ මෙරට එක්තරා ප්‍රමාණයකට ව්‍යවහාරයේ පැවැති චිත්‍රාක්ෂර ක්‍රමයක එක් අක්ෂරයක් පමණක් බව පහද දෙයි.


මෙරට ආදී බ්‍රාහ්මී සෙල්ලිපි ගණනාවක්ම සියුම් පරීක්ෂණයට භාජනය කළ පරණවිතාන මහතා ඒවායේ සටහන් වී ඇති බ්‍රාහ්මී නොවන සංකේත ගණනාවක්ම ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රාවල දක්නට ලැබෙන එසේම ඉන්දුනිම්න අක්ෂර හැටියට පිළිගන්නා සංකේත සමග සසඳමින් ඒවා මෙරට භාවිතයේ තිබී අභාවයට ගිය චිත්‍රාක්ෂර ක්‍රමයක් බව සනාථ කිරීම සඳහා සින්ධු ලේඛණ කියවීමට යෝජිත ක්‍රමයක් මාතෘකාවෙන් ශාස්ත්‍රීය දේශනයක් පැවත්විය.3 එහිදී උත්තරභාරතයේ හා ලංකාවේ ක්‍රිස්තු පූර්ව යුගයට අයත් ඇතැම් කාසිවල සටහන් වී ඇති සමහර සළකුණු වල මූලාදර්ශය ඉන්දු නිම්න අක්ෂර මාලාවේ දක්නට ලැබෙන බවට සී. ඇල්. පැබ්‍රි මහතා දක්වා ඇති අදහස තහවුරු කරන මෙතුමා දැනට ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ නටබුන් සොයාගෙන ඇති කාතියවාර් නොහොත් ලාට රට සිට ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ විජයන්ගේ සභ්‍යත්වයේ කොටසක් ලෙස හරප්පා ශිෂ්ටාචාරයට අයත් නෂ්ටාවශිෂ්ට සංස්කෘතික ලක්ෂණ ඇතුලත් වීමට බෙහෙවින්ම ඉඩ කඩ ඇති බවද පහද දී ඇත.

ගමණි තිෂ නැමැත්තෙකු විසින් කරණු ලබන පූජාවක් ගැන කියවෙන හෙන්නන්නේගල විහාරයේ ශිලා ලිපියකද දෙවනපිය අභයගේ පුත් තිෂ නැමැත්තෙකුගේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ලෙන් විහාර බ්‍රාහ්මී ලිපියකද ගමණි තිෂ අභිදානය දරූ සද්ධාතිස්ස රජුගේ (ක්‍රි. පූ. 137-119) දඹුළු ලෙන කටාරම් ලිපියේද4 ඉහත දක්වූ රේක්කය සහිත ස්වස්තික සළකුණු දක්නට ලැබේ. ඉන්දියාවේ කුනින්ද පාලකයෙකු වූ අමෝඝ

---

1. Parker, Henry. Ancient Ceylon, London, 1909 Fig 155; Codiington, H. W. op. cit. pl 1, ; Supplementary plate
2. Codrington, op-cit p. 20
3. පරණවිතාන එස්. සින්ධු ලේඛණ කියවීමට යෝජිත ක්‍රමයක්, ශ්‍රී සුමංගල විද්‍යෝදය විශ්වවිද්‍යාලය; මෑතදී අනුරපුර කැණීම්වලින් මතු වූ මැටි කැබලිතිවල මේ සළකුණු රාශියක් දක්නට ලැබෙ. Ancient Ceylon No 2. pp 123. 124
4. - එම -

භූතිෂ ගේ කාසි දෙකක ඇති1 අමෝසභූතිෂ නම් බ්‍රාහ්මී පාඨ දෙකක් විමසුමට ලක්කළ පරණවිතාන ශූරීහු පළමු පාඨයේ බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියා ඇති තිෂ යන්න දෙවැනි පාඨයේදී ස්වස්තික සංකේතයෙන් දක්වා ඇති අයුරු පහදා දෙති. මේ ආකාරයට සාක්ෂි දක්වමින් තවත් බ්‍රාහ්මී නොවන සංකේත රාශියක් පිළිබඳව නව අර්ථකථනයන් සපයන මෙතුමා ස්වස්තික සළකුණෙන් ''තිෂ'' යන්නද ඊට සම්බන්ධකොට ඇති රේක්කය හා සමාන සළකුණෙන් පැරණි ග්‍රාමණේය, ග්‍රාමණී, ගමණී ශබ්දයද සංකේත කොට දක්වා ඇති බව දක්වමින් ඒ අනුව ඉහත කී සංකේතය ''ගමණී තිෂ'' යනුවෙන් කියවිය හැකි බව පවසයි.

ඉහත කී ලිපියේදී පරණවිතාන මහතාගේ පර්යේෂණයට හසුනොවූ සංකේතයක් උත්තර භාරතයේ ක්‍රිස්තු පූර්ව යුගයට අයත් ධරණ කාසියක සටහන් වී ඇති බව අපට සොයා ගැනීමට හැකිවිය. එහි ගමණී උතිගේ මිහින්තලා ලිපියේ සඳහන් බ්‍රාහ්මී නොවන සංකේතය වූ ඉහත දක්වූ ස්වස්තික සළකුණ වෙනස් වී පහතින් ඇති රේක්ක සළකුණ ඒ අයුරින්ම සඳහන්  සළකුණ ඒ ආකාරයෙන්ම සටහන් වී ඇත.2 ඒ පමණක් නොව උත්තර භාරතයේ ක්‍රිස්තු පූර්ව යුගයේ ධරණ කාසිවලද ඉන්ද්‍රනිම්න මුද්‍රාවල ඇති සළකුණු රාශියක් සටහන්වී ඇති අයුරු අපට සොයා ගැනීමට හැකිවිය. මේ අතර ස්වස්තිකයද රේක්කය සමාන සළකුණට සම්බන්ධ කරණ ලද සළකුණුද වේ.3

මේ අනුව බලනවිට අපේ පැරණි කාසිවල හා බ්‍රාහ්මී සෙල්ලිපිවල සඳහන් සංකේත ඉන්ද්‍රනිම්න ශිෂ්ටාචාරයේ පමණක් නොව ක්‍රිස්තු පූර්ව යුගයේ උත්තර භාරතයේද ව්‍යවහාරයේ පැවති බව නිගමනය කිරීමට හැකිය. මෙකී ශ්‍රී ලාංකික කාසියේද ඊට පෙර හා පසු ලංකාවේ භාවිතා වූ කාසි වලද සටහන් කර ඇති සංකේත බොහොමයක්ම විශේෂයෙන් උත්තර භාරතයේ ක්‍රිස්තු පූර්ව අවදියේ පටන් භාවිතයේ පැවති කාසි වල හා මුද්‍රාවල සටහන් කර ඇත.

කෙසේ වෙතත් පරණවිතාන මහතාට පෙර හේරස් පියතුමාත් සී. ඇල්. පැබ්‍රි මහතාත් ලංකාවේ කාසි වල සටහන් වී ඇති මේ සළකුණු චිත්‍රාක්ෂර ක්‍රමයක් වියයුතු බවට අදහස් ඉදිරිපත් කර තිබුණි.4 පැරණි ශ්‍රී ලාංකිකයන් තම නිල තත්ත්වය වංශය හෝ කුල තත්ත්වය හැඳින්වීම සඳහා යම් යම් සංකේත භාවිතා කළ බව සිතීමට තුඩුදෙන සාක්ෂි අපට හමුවේ. ඉතා පැහැදිළි උදාහරණයක් නම් මඩවල ලිපියේ රජයෙන් ආචාරි පරමනයාට දෙන දීමනාවක් සඳහන් වන අතර ලිපියේ ආරම්භයේ පසෙකින් කිනිහිරයක් අඩුවක් සහ මිටියක සළකුණ කොටා ඇත.5 මෙය ඔහුගේ නිල මෙන්ම කුල තත්ත්වයේද සළකුණයි. ඒ අයුරින් බලන කල්හි බ්‍රාහ්මී සෙල්ලිපිවලද පසෙකින් කොටා ඇති සංකේත මගින් ලිපිය ලියූ තැනැත්තා හැඟවීමක් හෝ ඔහුගේ නිල තත්ත්වය පෙන්නුම් කරන්නට ඇත. පළමුවරට මෙම කාසිය සොයාගත් හෙන්රි පාකර් මහතාද මෙම සංකේතය රාජකීය මුද්‍රාව හෝ සළකුණ විය යුතු බව අනුමාන කොට ඇත.6

කෙසේ වෙතත් පරණවිතාන ශූරීන්ගේ මෙම නවතම අදහස අප පිළිගත හොත් ඉහත කී කාසිය පිළිබඳ පමණක් නොව අපේ කාසි පිළිබඳ ඉතිහාසයටද නව එළියක් වැටෙනු ඇත. එසේ වූවහොත් මෙම කාසි නිකුත් කොට ඇත්තේ ''ගමණී තිෂ''

1. පරණවිතාන එස්, සින්ධුලේඛණ කියවීමට යෝජිත ක්‍රමයක්, ශ්‍රී සුමංගල
2. S ng. S. S. Early Coins of North India. New Delhi 1984. Pl XV. 174
3. Sing. S. S. op, cit. pl. XIV, XV.
4. JRAS. (CB) VIII p. 151
5. E. Z. III Plate 27
6. Parker, Henry, Ancientl Ceyon, London, 1909, p. 492

අභිදනය දූරු පාලකයෙකු හෝ පාලකයින් විසින් වෙයි. අපේ සෙල්ලිපි මූලාශ්‍ර අනුව ක්‍රි. පූ. 3–1 සියවස් තුළදී ගමණී තිෂ අභිදනය දූරු පාලකයින් කීප දෙනෙකු පිළිබඳ තොරතුරු ලැබේ. දෙවන පැතිස්, යටාලතිස්ස, කාවන්තිස්ස, සද්ධාතිස්ස, ඒ අතරට වැටේ. එසේ නම් අවස්ථා කීපයකදී නිෂ්පාදනය වූවායැයි අපට ඔප්පු[1] කළ හැකි මේ කාසි ඉහත කී පාලකයන්ට අයත් වන්නට ඇත.

දෙවනුව ලංකාවේ අක්ෂර පාඨ සඳහන් ප්‍රථම කාසි හැටියට තවමත් පිළිගනු ලැබෙන ක්‍රි. ව. 4–6 සියවස් අතරට වැටෙන රන්කහවණු වලට ඒ තත්ත්වය අහිමිවී කාසිවල අක්ෂර පාඨ සටහන්වීමේ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව යුගය දක්වා මේ නිසා විහිදී යයි. පරණවිතාන මතය අනුව ඉහත කී සළකුණු අක්ෂර වශයෙන් පිළිගතහොත් මේ වනවිට ඉන්දියාවේත් ලංකාවේත් වඩාත් ප්‍රචලිතව තිබූ බ්‍රාහ්මී අක්ෂර ඒ සඳහා යොදා නොගෙන වෙනත් අක්ෂර ක්‍රමයක් යොද ගන්නට ඇත්තේ පරණවිතාන මහතා පවසන හැටියට නම් විවිධ වෙළඳ ශ්‍රේණි අතර මෙම අක්ෂර ව්‍යවහාරයේ පැවතීම නිසාය. ඒ හැරත් කාසියේ ඇති ඉඩ ප්‍රමාණයද ප්‍රයෝජනයට ගැනීමේදී උපක්‍රමයක්ද විය හැකිය.

පරණවිතාන සමරු කලාපයට පුරාතන ලංකාවේ බෞද්ධ ස්වස්තික කාසිවල ඇති සංකේත මැයෙන් ලිපියක් සපයන ඩී. පී. ඊ. හෙට්ටිආරච්චි මහතා මෙහි අභිමුඛයේ ඇති සළකුණු සියල්ල එක්ව ගනිමින් එයින් බුද්ධචරිතය නිරූපනය කර ඇති බව දක්වීමට උත්සහ දරා ඇත.[2] ඒ අනුව ඉහත කී ස්වස්තික සළකුණ බුදුන් වහන්සේගේ ප්‍රථම දහම් දෙසුම නිරූපනය කිරීම සඳහා යොද ඇති බව පවසයි. මෙකී රේක්කය සහිත ස්වස්තික සළකුණේ ඇති ත්‍රිකෝණික හැඩය ප්‍රතිමා ලක්ෂණ අනුව හිඳගෙන සිටින බුද්ධ ප්‍රතිමාවට සමාන බවද ස්වස්තිකයෙන් ධර්මචක්‍රය පිළිබිඹුවන බවද රේක්කය හා සමාන සටහනෙහි ඇති කුඩා රේඛා සතරින් බුදු දහමෙහි ඇති සතර ඵල සිහිගැන්වෙන බවද සාක්ෂි වශයෙන් මෙහිදී ඉදිරිපත් කොට ඇත.

එහෙත් මේ අදහසෙහි ඇති ප්‍රධාන දුර්වලකම වනුයේ අභිමුඛයේ ඇති තුන් කොන් සටහන හා තිත් සළකුණු පිළිබඳව කිසිදු අවධානයක් නොදක්වා තිබීමය. එම සළකුණු බුද්ධ චරිතයට සම්බන්ධ කිරීමට ඒ මහතා අපොහොසත් වී ඇත. තවද අභිමුඛයේ සළකුණු වලින් පිළිවෙළින් ඇතාගෙන් උත්පත්තියද, වෘක්ෂයෙන් බුදුවීමද, ස්වස්තිකයෙන් ප්‍රථම ධර්ම දේශනාවද අවසානයට චෛත්‍ය සළකුණින් පරිනිර්වාණයද පිළිබිඹු වන බව දක්වූවද ප්‍රතිමුඛයේ ස්වස්තිකය, නන්දිපාදය අංකුසය, චෛත්‍ය ලකුණු ආදී වශයෙන් ඇති සළකුණු සම්බන්ධයෙන් එවැනි අදහසක් තහවුරු කිරීම අපහසු වනු ඇත. එපමණක් නොව අනුරපුර මුල්යුගයේදී භාවිතාවී ඇති ශ්‍රී ලක්ෂ්මී තහඩු කාසිවල එක් පැත්තක් සම්පූර්ණයෙන්ම වෙන්වී ඇත්තේ මෙම රේක්කය සහිත ස්වස්තිකය සඳහාය. ඒ හැරත් බ්‍රාහ්මී කටාරම් ලිපිවල පසෙකින්ද මේ සළකුණ ඇති බව ඉහතදී සඳහන් කරන ලදී. මේ නිසා කාසියක එක් පැත්තක ප්‍රථම දහම් දෙසුමත් අනෙක් පැත්තේ ලක්ෂ්මී දෙවගනත් සටහන් කිරීමේ හේතුවද ඔප්පු කිරීමට අපහසු වේ. තවද මේ වර්ගයේ කුඩා කාසිවල ඇතා වෙනුවට අශ්වයා සිංහයා ආදී රූපද සටහන් වී තිබීම[3] ඉහත කී මතය ප්‍රතික්ෂේප වීමට තවත් සාධකයකි.

---

1. ඉදිරි පිටු බලන්න.
2. Hettiaratchi D.P.E. op. cit.
3. Codrington, H. W. op. cit. pp. 22-24

මේ අතර මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි ඉහත කී සංකේතයෙන් මහායාන බුදු දහමේ වෛරෝචන, රත්න සම්භව, අමිතාභ, අමෝඝසිද්ධි හා අක්ෂෝභ්‍ය යන බුදුවරුන් නිරූපනය කෙරෙන බව අනුමාන කර ඇතත්1 එය පදනමකින් තොරව අදහස් ඉදිරිපත් කිරීමක් පමණකි. විශේෂයෙන්ම ලංකාවේ මෙම කාසි මුද්‍රණය වූ අවදියේදී මෙම මහායාන අදහස් කෙතෙක් දුරට පැතිරී තිබුණාදැයි විමසිම වටී. ස්වස්තිකය ලෝකයේ විවිධ සංස්කෘතීන්හි ශුභ සළකුණක්සේ සළකා ඇති හෙයින් මේ සළකුණද එක්තරා විදියක විශේෂ ස්වස්තිකයක් පමණක් හැටියට පමණක් සැළකිමට සමහර වියතුන් උත්සාහ කර ඇතත්2 ඇත්ත වශයෙන්ම මෙය වෙනම සාකච්ඡා කළ හැකි ස්වස්තික සළකුණ පමණක් නොව ඊට වඩා වෙනස් වූ සංකේතයක් බව ඉහත දක්වූ සාක්ෂිවලින් පැහැදිලි වේ. ලෝකයේ ස්වස්තික සළකුණු පිළිබඳව විශේෂ අධ්‍යයනයක යෙදුණු තෝමස් විල්සන් මහතා ස්වස්තික සළකුණක් හැටියට මේ සලකුණ සැළකිල්ලට ගෙන නැත.3 එසේ හෙයින් මෙය ස්වස්තික සළකුණක් හැටියට ගැනීමට හෝ විවිධ සංස්කෘතීන්හි ස්වස්තිකය ලබා තිබු ස්ථානය පිළිබඳ විමසීමට හෝ අපට අවශ්‍ය වේ යැයි නොසිතමු.

ඇත් රූපය කාසියේ අභිමුඛයේ ඇති තවත් කැපී පෙනෙන සළකුණකි. මේ සළකුණ කාසියේ සටහන් කිරීමේදී සමකාලීන සමාජයේ ආගමික වශයෙන් ඇතා ලබා තිබූ තත්ත්වය ඊට හේතු විද නොඑසේ නම් පාලකයා සතු නිත්‍යානුකූල බලය දැක්වීම සඳහා රජ්‍ය සංකේතයක් වශයෙන් සටහන් කළාද යන්න නිරාකරණය කිරීම තරමක් දුෂ්කරය. කෙසේ වෙතත් පෙරදිග සමාජයේ පුරාණයේ සිටම ඇතා විශේෂ වැදගත් කමක් ලබා තිබූ බවට නම් සාධක අවශ්‍ය තරම් හමුවේ. මේ අනුව ඇතා හැම විටම සඳහන් වී ඇත්තේ ශුභ ඵල දෙන වස්තුවක් හැටියටය.

තමා අවට පරිසරයේ ඇති ස්වභාවික වස්තු දේවත්වයට නැගූ ඈදිතම මිනිසා සමහර සතුන් එම දෙවි දේවතාදීන්ගේ යාන වාහන ලෙස පවරා දුනි. මේ අනුව දෙවිවරුන්ගේ ප්‍රධානියාවූ ඉන්ද්‍ර දෙවියාගේ වාහනය බවට පත් වූයේ ඓරාවත නම් ඇතාය. ඉන්ද්‍ර දෙවියාට ඓරාවත ලැබුණේ සුරාසුර යුද්ධයේදී කිරි සයුර කැළඹීමෙන් බව මහා භාරතයේ එන කතා පුවතකින් පැහැදිලි වේ.4 තවත් ප්‍රවාදයක් අනුව දෙව්ලොව හා මෙලොව ඇතුන්ගේ උප්පත්තිය මහා බ්‍රහ්මයාගේ මන්ත්‍ර ජප කිරීමක් නිසා සිදුවූවකි.5 බෞද්ධ සාහිතයේදී ශක්‍ර වශයෙන් සඳහන් වන ඉන්ද්‍රගේ වාහනය වූ ඇතා පිළිබඳ අතිවිශේෂ වර්ණනා දක්නට ලැබේ.6

ඓරාවත යන්නෙහි අරුත ජලය ඇත්තා බව හෙන්රිෂ් සිමර්, පරණවිතාන කඹුරුපිටියේ වනරතන නාහිමි ඈදී වියතුන් පෙන්වා දී ඇත.7 කෘෂි කාර්මික සමාජයක මිනිසාට ඉතා වැදගත් වන වර්ෂාව ලබා දෙන මේඝය ඇත් රුවින් සංකේතවත් කරණු,

---

1. විමලකිත්ති හිමි, මැද උයන්ගොඩ, ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය, පිට 13.
2. කල්දේරා, ලීලානන්ද, ලංකාවේ ලීල මුදල්. පිට 7.
3. Wilson, Thomas; The Swastika, 1894 Washington.
4. Maha Bharata – 1.18.40
5. Zimmer. H, Myths and Symbols in Indian Art and Civilizgation, 1974 – pp 103–4
6. බුත්සරණ, ලෝක විවරණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, 1966 කොළඹ පි.52, අමාවතුර, දෙව්දමනය, වැලිවිටියේ සෝරත හිමි, සංස්කරණය 1948 කොළඹ. 162 පිට.
7. Zimmer, Henrich; Myths and Symbols in Indian Art and Civilization, 1974 p. 104 Paranavitana S. "The Sculpture of Man and Horse near Tissavava" Artibus Asea. No. XVI pp. 167–190

ලබන බව ඔවුන්ගේ අදහසයි. ඉසුරුමුණියේ අශ්වහිස හා මිනිස් රූ කැටයමින් පර්ජන්‍යද එතැනම ඇති පොකුණේ දිය කෙළින ඇත් රූ වලින් මේඝයද නිරූපණය වන බව පරණවිතාන මහතාගේ අදහසවේ. නෙළුම් අතර දිය කෙළින ඇත් රූ හමුවන්නේ මෙතැන පමණක් නොවේ. මහල් උයනේ පොකුණේ දෙපැත්තේද ඇත් පොකුණේ මැතදී හමුවූ ගල් පුවරුවකද සාංචියේ කැටයම්වල ද මේ හා සමාන රූප කැටයම් දක්නට ලැබේ.1 ඉසුරුමුණියේ පැරණි නාමය මේඝගිරිය බවත් අතීතයේ මෙතැන වර්ෂාව ලබා ගැනීම පිණිස පුද පූජා පවත්වා ඇති බවත් පරණවිතාන මහතා පවසා ඇත.2 වෙස්සන්තර ජාතකයේ සඳහන් අයුරු වෙස්සන්තර රජතුමාගේ පණ්ඩර නම් මංගල හස්තියා වැස්ස ලබාදීමට හැකිකම නිසා අවට රටවල ප්‍රසිද්ධ වී ඇත.3

දිග්ගජ නම් ඇතුන් අටදෙනෙකු විසින් මහ පොළොව දරා සිටින බවත් ඓරාවත එයින් පූර්වදිග් භාගයට අධිපතියා බවත් තවත් ප්‍රවාදයකි.4 හිංදු දර්ශනයේදී පමණක් නොව බෞද්ධ ජෛන සාහිත්‍යයේද වෙනත් කිසිදු සතෙකුට හිමිවී නැති තැනක් ඇතාට හිමිවී ඇත. සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගැනීම සිහිනයක් තුළ සංකේතවත් කොට ඇත්තේ සුදු ඇත් පැටියෙකු මහාමායා දේවියගේ කුසට ඇතුල්වන බව සිහිනෙන් දුටු බව දක්වීමෙනි. ජෛන කල්ප සූත්‍රයේද ජෛනාගමේ ආදිකර්තෘ මහාවීර තුමාගේ උත්පත්තියට ප්‍රථම එතුමාගේ මවු වූ ත්‍රිශලා දුටු සිහින අතර ශ්‍රී ලක්ෂ්මී දෙවඟන ඇතුන් විසින් අභිෂේක කරවන හැටි එක් සිහිනයකි.5 මේ හැර බුදුන් වහන්සේට උපස්ථාන කරන්නෙකු හැටියට පාරිලෙය්‍යය ඇතා බෞද්ධ සාහිත්‍යයේ සඳහන්ය.

බෞද්ධ සාහිත්‍යයේ බුදුන් වහන්සේ හස්තියෙකුට උපමා කොට ඇති තැන් බොහෝය. නාග යනු හස්තියාට ඇති පර්යාය නාමයකි. ධම්මපදයේ නාගවග්ගය සකස් වී ඇත්තේ මේ හස්ති උපමාව පදනම් කොට ගෙනය. බුදුන්වහන්සේ එහිදී තමා හස්තියෙකුට සමාන බව සඳහන් කොට ඇත. (අහං නාගොව සංගමෙ) හස්තියාට මධ්‍යම පුරුෂයන් දස දෙනෙකුගේ බලය ඇත්තාක් මෙන් බුදුන් වහන්සේටද දශබල කයක් මෙන්ම දශබල ඥාණයක්ද ඇතැයි පැවසේ. බුදුන් වහන්සේ දශබලධාරී වේ. අංගුත්තර නිකායේ බුදුන්වහන්සේ හා හස්තියා (නාග) අතර සම්බන්ධය පෙන්වමින් ''අකුසල නොකෙරේද හේ නාගයාය, සුරතභාවය හා අවිහිංසාව එබඳු නාගයාගේ පෙර පාදයෝය, තපස හා බ්‍රහ්ම චරියාව පසු පාදෙකයි. ශ්‍රද්ධාව සොඬයයි. උපේක්ෂාව දෙදළයි. හොඳ සිහිය ග්‍රිවාවයි, ප්‍රඥාව ශිර්ෂයයි. ධර්ම චින්තාව සොඬ අගයි ධර්මය උදරයයි......6 මජ්ජිම නිකායේ රථ විනීත සූත්‍රයේ සාරිපුත්‍ර හා මන්තානි පුත්‍ර මහ රහතන් දෙනම හඳුන්වා ඇත්තේද මහා නාගයන් යනුවෙනි.7

---

1. වනරතන හිමි, කඹුරුපිටියේ, අනුරපුර නටබුන්, මාතර, 1970 පිටු 156-58. Zimmer H. op. cit. II Pl. 31 d.
2. Paranvitana, S. op. cit.
3. වෙස්සන්තර ජාතකය, පන්සිය පනස් ජාතක පොත් වහන්සේ, චතුවත්තේ පේමානන්ද හිමි, සංස්කරණය 2086 පිට. 1959 කොළඹ.
4. Zimmer, Henrich, op. cit. pp. 103 – 4
5. Thaplyal, K. K.; Studies in Indian Seals, Lucknow. 1972
6. වනරතන හිමි, කඹුරුපිටියේ, ලක්දිව බුදු පිළිමය මාතර, 1985 පිට 66 සිට
7. – එම – පිටු 66, 100; Ancient Ceylon No. 3, 1979, Journal of the Archaeological Survey Department of Sri Lanka. pp. 161 – 165.

භාරතයේ බුද්ධාගමේ වර්ධනයක් ඇතිවූ අශෝක අධිරාජයාගේ අවදියේදී රට පුරා පිහිටවූ කුළුණු මුදුනේද පර්වත වලද ඇතා ජාතික හා ආගමික සංකේතයක් වශයෙන් කැටයම් කොට ඇත. එම කුළුණු හිස්වල දක්නට ඇති ඇත් අස් ගව සිංහ ආදී රූ දිශා දැක්වීම සඳහා කැටයම් කොට ඇතැයි අදහස් ඉදිරිපත් වී ඇතත් එය එසේ නොව බුදුගුණ දැක්වීම සඳහා කරණ ලද්දක් යැයි මෑතදී නවතම මතයක්ද ඉදිරිපත් වී ඇත. අශෝක රජතුමාගේ ගිර්නාර් පර්වත ලිපියේ "සර්වශ්වේතො හස්ති සර්වලොක සුඛා හරො නාම (සම්පූර්ණ සුදු ඇතා මුළු ලොවට සතුට ගෙන දේ.) කල්සි ගිරි ලිපියේ "ගජතමෙ" යනුවෙන්ද නැගෙනහිර ධෞලි ගිරි ලිපියේ "සෙතො" යනුවෙන්ද සඳහන්කොට ඇත් රූප කොටා ඇත.1 විශේෂයෙන් ගිර්නාර් පර්වත ලිපියෙන් ඇතා ශුභ වස්තුවක් ලෙස සැලකූ බව මනාව පැහැදිලි වේ. සර්ව ශෙව්තො හස්ති යන්නෙන් මෙහිදී බුදුන් වහන්සේ අදහස් කළා විය යුතුය.

පැරණියේ පෙරදිග රටවල පාලකයෙකු සතු වස්තු අතර ඇතාට අති විශේෂ තැනක් ද හිමිවී ඇත. උදහරණයක් වශයෙන් වෙස්සන්තර රජුගේ හා දුටුගැමුණු රජුගේ රාජකීය හස්තීන් දේව අනුහසින් ඔවුන්ට ලැබුණු වස්තූන් ලෙස දැක්වේ.2 රාජ්‍ය බලය ලබා ගැනීමට අරගල කළ කුමරුන් ඒ සඳහා උරුම කම් කීමට මංගල හස්තියා ලබා ගැනීමට වෙර දැරූ අවස්ථා ඇත.3 අනුප්‍රාප්තිකයෙකු නොමැතිව පාලකයෙකු මියගිය කල්හි රජකම සඳහා වඩාත් සුදුස්සා තේරීම පිණිස මංගල හස්තියා සරසා යැවීමේ ද සිරිතක් පැවත ඇත. මහනුවර යුගයේදී පවා මේ අදහස පිළිගැණුනු බව ශ්‍රී වික්‍රමරාජසිංහ රජකමට තෝරා ගැනීමේදී ඒ සඳහා මේ පිළිවෙත අනුගමනය කළැයි ජනප්‍රවාදයේ සඳහන් වීමෙන් පෙනේ. මේ අයුරින් බලනවිට හස්ති රූපය ආගමික අංගයෙන් පමණක් නොව රාජ්‍ය පාලන අංශයෙන්ද වැදගත් තැනක් හිමිකරගෙන ඇති බව පෙනේ.4

**වෘක්ෂය**

සිරස් හා තිරස් අතට විහිදුණු රේඛා දෙකින් කොටස් හතරට බෙදුණු සතරැස් කොටුවක් මතුපිට ඇති අතු විහිදුණු වෘක්ෂයක් කාසියේ අභිමුඛයේ ඇත. මේ සංකේතය පිළිබඳ කරන විමසීමකදී මේ හා සහමුලින්ම සමාන හෝ මඳ වශයෙන් වෙනස් වන වෘක්ෂ සංකේත උත්තර භාරතයේ සමකාලීන මෙන්ම පූර්වකාලීන කාසිවල සටහන් වී ඇති බව සැළකිල්ලට ගත යුතුව ඇත.5 ක්‍රිස්තු පූර්ව තුන්වැනි සියවසට අයිති සේ පිළිගෙන ඇති එවැනි උත්තර භාරතීය කාසි හා 6 අපේ මෙම කාසිය සැසඳීමේදී මෙම වෘක්ෂ සංකේතය අපට විශේෂ වූවක් නොව අපේ මුල් කාසි නිශ්පාදනයට බලපෑ උතුරු ඉන්දීය කාසි අනුකරණය කිරීමක් වීමට හොඳටම ඉඩකඩ ඇත. ඒ නිසා භාරතීය කාසිවල මේ සංකේතය කුමන අරමුණකින් සටහන් කරන්නට ඇත්දැයි විමසා බැලීම වටී.

---

1. Paranavitana Felicitation Volume on Art & Architecture and oriental Studies. 1965, Colombo, p. 232.
2. වෙස්සන්තර ජාතකය, පන්සියපනස් ජාතක පොත් වහන්සේ, වතුවත්තේ පේමානන්ද හිමි සංස්කරණය, 1959 කොළඹ
3. මහාවංශය, බටුවන්තුඩාව හා සුමංගල හිමි පරිවර්තනය.
4. මේ හැර අනුරපුර අවදියේ භාවිතයේ පැවති අපගේ ධර්මචක්‍ර කාසිවලද සිටගෙන සිටින ඇත්රූව දක්නට ලැබේ.
5. Codrington op. cit plate I. 6. Allan, J. Catalouge of the coins of Anicent India, London Plate VII; Sing S. S., Early coins of North India – An Iconograph study, New Delhi 1984 plates VII – XI
6. Sing S. S., op. cit p. 19; Journal of Numismatic society of India XVII, p. 21

අතිපුරාණයේ සිටම මිනිසා අතර පූජනීයත්වයට පත්වූ සම්භාවධර්මයේ පැවති විවිධ වස්තූන් අතර වෘක්ෂයද ප්‍රධාන තැනක් ගනී. යම් යම් වෘක්ෂ හෝ පැලෑටි වලින් මිනිසාට ඇති ප්‍රයෝජනයම නිසාම නොව විශාල වෘක්ෂ යම් යම් දෙවි දේවතාවුන්ගේ හෝ යක්ෂ නාග භූතාදීන්ගේ වාසස්ථාන බවට විශ්වාස කිරීම හේතුවෙන්[1] ඇතිවූ ගෞරව සම්ප්‍රයුක්ත බියක් නිසා මෙම වෘක්ෂ වන්දනාව ආරම්භ වීමත් වර්ධනය වීමත් සිදුවන්නට ඇත. එක් එක් පවුල් සඳහා වෙන්වූ කුල දේවතාවුන් හා ඔවුන් එම ගෘහ ආසන්න වෘක්ෂයන් වාසස්ථාන කරගෙන සිටින බවට වූ විශ්වාසය වෘක්ෂ වන්දනාවේ තවත් වර්ධන අවස්ථාවකි. එවැනි වෘක්ෂ දේවතාවකු සඳහා කිරිපිඩු දනයක් දෙන සුජාතාවගේ බෞද්ධ කතාපුවත ක්‍රි: පූ: තෙවැනි සියවසේදී කැටයමට නගා තිබීම දක්නට ලැබේ.[2] බෞද්ධයන් අතර තම ආගමික කර්තෘවරයාට බුද්ධත්වය ලබා ගැනීමට උප කාර වූ වෘක්ෂය හැටියට කළගුණ සැළකීම වස් වෘක්ෂ වන්දනාව පිළිගැණුන බව පෙනේ.

භාරතයේ වෘක්ෂ වන්දනාව පිළිබඳව සාක්ෂි ලැබෙන ආදිතම අවස්ථාව හැටියට ඉන්දුනිම්න ශිෂ්ටාචාරය දැක්විය හැකිය. එහි හමු වූ එක් මැටි මුද්‍රාවකින් වැටකින් වටවූ ඇසතු ගස යැයි විශ්වාස කරන වෘක්ෂයට වන්දනා මාන කළ බව පෙනේ. තවත් මුද්‍රා වක රුක්ෂ ගසක අතුපතර දේවතාවියක් සිටින අතර ගසමුල අඩ දණින් සිටින රුවකි. තවත් මුද්‍රාවක ගසක් මුල කෙරෙන බිලි පූජාවකි. තවත් මුද්‍රාවක ස්ත්‍රී යෝනියකින් මතුවන පැලෑටියකි.[3] පිප්ඵල හෝ අශ්වත (ඇසතු) වෘක්ෂය බෞද්ධයන්ගේ පමණක් නොව පුරාණයේ සිටම හින්දූන්ගේද විශ්වාසයට පාත්‍ර වූ ගසකි. දෛනික ජීවිතය කෙරේ බලපෑ අශුභ බලපෑම් වලක්වා ගැනීමේ අටියෙන් පමණක් නොව මියගියවුන්ගේ ආත්මය පරලොවදී ලබා ගැනීමේ අටියෙන්ද ඇසතු ගස ජලයෙන් නෑවීම අද දක්වා හින්දූන්ගේ විශ්වාසයක්ව පවතී.[4] මේ අනුව ආත්මයක මෙලොව හා පරලොව අතර ඇති සම්බන්ධය පවත්වන වෘක්ෂයක් හැටියට ඇසතු ගස විශ්වාසයට පාත්‍ර වී ඇති බව පෙනේ. අශෝක ගසද කාන්තාවන්ට දරුඵල ලබා දීමට බලයක් ඇතැයි යන විශ්වාසය මත හින්දූන් අතර පූජනීයත්වයට පත්ව ඇති තවත් වෘක්ෂයකි. නුග ගසද අතීතයේ සිට වත්මන් අවදිය දක්වාම බෞද්ධ හා ජෛන භක්තිකයින් අතර පූජනීයත්වයට පත්ව ඇති බවට සාක්ෂි ඇත.[5] තුලිසි පැලෑටිය විෂ්ණු දෙවියන්ගේ වාසස්ථානය මෙන්ම රෝග සුව කරන්නක් ලෙස භාරතීය වාසීන්ගේ විශ්වාසයට පාත්‍රව ඇත. දිඹුල් ගසටද පුරාණ භාරතයේ එවැනිම වැදගත් කමක් හිමිවූ අතර තෙවැනි දෙව්ලොව දෙවිවරුන් වැඩ සිටින්නේ මේ වෘක්ෂය යට බව චන්දොග්‍ය හා කෞෂතකී උපනිෂද්හි දැක්වේ.[6] මේ හැර දෙව්ලොව ඇතැයි සැළකෙන ශුභඵල ගෙන දෙන වස්තුවක් හැටියට හින්දූන් ගේ මෙන්ම බෞද්ධයින්ගේද විශ්වාසයට පාත්‍රව ඇති කල්ප වෘක්ෂයට භාරතයේ මෙන්ම ලංකාවේද කැටයම් අතර විශේෂ ස්ථානයක් හිමි වී ඇත.[7] එහෙත් මෙම කැට යම් වල කල්ප වෘක්ෂය මතුවීම බොහෝ කොටම ඇත්තේ කළසකින් හෝ වේදිකාව කිනි. භාරතයේ හෝ ලංකාවේ කාසිවල සඳහන් අයුරු සතරැස් කොටුව හෝ කොටු පවුර දක්නට නොලැබේ. එසේ හෙයින් කාසිවල සටහන් කර ඇති වෘක්ෂය දෙරටෙහිම වෙනත් කැටයම් වල දැක්වෙන කල්ප වෘක්ෂය යැයි දැක්වීම තරමක් අපහසුය.

---

1. Coomaraswamy, A. K. History of Indian and Indonesian art, London 1929. p. 47.
2. සිංහල විශ්වකෝෂය 1 වෙළුම ඡායාරූප 648 පිට.
3. Marshall J. Mohen-jo-daro and Indus Civilization, London, 1931. Plate XII Sing. S.S. op. cit. p. 19
4. Sing. S. S. op.cit. p. 19
5. Sing . S. S. op. cit. p.p. 18-19
6. Ibid.
7. කණ්ටක චේතියේ වාහල්කඩ කුළුණු කැටයම්.
   Universiiy of Ceylon History of Ceylon Vol. 1. 1. Plate VII

කාසිවල ඇති මෙම සළකුණු වලින් දක්වෙන්නේ පැරණි හිංදු සාහිත්‍යයේ සඳහන් චෛත්‍ය වෘක්ෂ හා ස්ථාල වෘක්ෂ බව ජේ. එන්. බෙනර්ජි මහතාගේ අදහස වේ.1 ඒ අතර ක්‍රිස්තු පූර්ව යුගයේ භාරතීය කාසිවල වෘක්ෂ සටහන යෙදුනේ ආගමික වැදගත්කම නිසාම පමණක් නොව තම ආහාරපානාදියේදී විශේෂ ස්ථානයක් ගත් වෘක්ෂලතාදිය ද දක්වීමට විය යුතු යැයි එස්. එස්. සිං මහතා පවසයි.2 බී. චටෙටා පාද්‍යයගේ අදහස වනුයේ ඉන්දුනිම්න ශිෂ්ටාචාරය ආදී වූ පූර්ව ආර්‍ය ශිෂ්ටාචාරයන්හි වූ වෘක්ෂ වන්දනාව භාරතයේ ආර්‍ය ශිෂ්ටාචාරය අතරද පැතිරෙමින් එහි ප්‍රධාන ආගමික විශ්වාසය වූ බවත් මේ සළකුණු වලින් දක්වෙන්නේ එම විශ්වාසයන් බවත්ය.3

අපගේ හැඟීමේ හැටියට නම් ශ්‍රී ලංකාවේ පැරණි කාසිවල සඳහන් වෘක්ෂ සටහන් උත්තර භාරතයේ කාසි අනුකරණය නිසාම සිදු වූවකි. ක්‍රිස්තු පූර්ව දෙවැනි තෙවැනි සියවස්වල ලංකාවේ වෘක්ෂ වන්දනාවක් නොතිබු බවක් එයින් අදහස් නොවේ. මිහිඳු හිමියන්ගේ ආගමික ප්‍රචාරයට පෙර මෙරට වැසියන් අතර වෘක්ෂ වන්දනාව පැවති බව මහා වංශයේ සඳහන් පණ්ඩුකාභය පිළිබඳ විස්තරාදියේ මනාව ඔප්පු වේ. මෙරට ආගමික ප්‍රචාරයේ නිරතව සිටි මිහිඳු හිමියන්ට කලකට පසු තම මව්රටට පත් යවා ශ්‍රී මහා බෝධි ශාඛාවක් මෙරටට ගෙන්වා රෝපනය කර වීමට හේතු වන්නට ඇත්තේද තවදුරටත් දෙවි දේවතාවුන් හෝ යක්ෂභූතාදීන් අරභයා වෘක්ෂ වන්දනාවට හුරු පුරුදු වී සිටි ශ්‍රී ලාංකිකයින් එයින් මුදවා බෞද්ධාගමික පැත්තට නැඹුරු කරවීමට විය යුතුය.

මහින්දගමනයෙන් පසු මෙරට විශේෂ ස්ථානයක් ගත්තා වූ වෘක්ෂය වූයේ ද මෙම අනුරපුර ශ්‍රී මහා බෝධිය යැයි සළකා මිහිඳු හිමියන්ගේ පැමිණීමෙන් පසු මෙරට මුද්‍රණය වූ කාසියක වඩා වැදගත් කොට දක්වා ඇති වෘක්ෂය විය යුත්තේ ශ්‍රී මහා බෝධිය යැයි කෙනෙකුට තර්ක කළ හැකි වුවද අප සාකච්ඡාවට භාජනය වී ඇති කාසියෙහි දක්වෙන වෘක්ෂය ශ්‍රී මහා බෝධි සළකුණමදැයි ස්ථිර වශයෙන්ම නිගමනයකට බැසීමට නොහැක්කේ මෙම කාසියේ සඳහන් ස්වස්තිකයට සමාන විශේෂ සළකුණ හැර වෘක්ෂය ඇතුළු අනිකුත් සියළුම සළකුණු පූර්වකාලීන හා සමකාලීන උත්තර භාරතීය කාසිවලද නොවෙනස්ව දක්නට ලැබෙන හෙයිනි. මෙම කාසිය පිළිබඳව පරණවිතාන සමරු කලාපයට ලිපියක් සපයන ඩී. පී. ඊ. හෙට්ටිආරච්චි මහතා මෙම වෘක්ෂ සළකුණින් ගෞතම බුදුන් වහන්සේගේ බුදුවීම සංකේතවත් කෙරෙන බව දක්වා ඇත.4 එහෙත් මේ කාසියේ අභිමුඛයේ දක්වෙන සළකුණු බුද්ධ චරිතයට සම්බන්ධ කිරීමට ඒ මහතා දරා ඇති උත්සාහය අසාර්ථක වී ඇති අයුරු ඉහතදී පෙන්වා දුනිමු. ඩී. බී. ස්පූනර් මහතාද ඉන්දීය කාසිවල සඳහන් වෘක්ෂ සළකුණින් බෝධි (ඇසතු) වෘක්ෂය නිරූපනය කරන බව ප්‍රකාශ කර ඇත ද පසුව එම අදහස වෙනස් කරමින් ඉරාණියන් ආගමික විශ්වාසයන්හි ගැජව ඇති සෝම පැලෑටිය මෙයින් අදහස් කෙරෙණ බව දක්වා ඇත.5

**පර්වතය:–**

කාසියේ අභිමුඛයේ මෙන්ම ප්‍රති මුඛයේද සටහන්ව ඇති මේ සංකේතය කවය පහතට හැරුණු ළඟින් පිහිටා ඇති අඩ කව දෙකකින්ද ඒ මතුපිට ඒ ආකාරයෙන්ම ඇති අඩ කවයකින්ද සැදුම් ලද්දකි. අභිමුඛයේ ඇති සළකුණෙහි පහතින් ඇති අඩ

1. Benerji, J. N. development of Hindu Iconography, Culcutta, 1966. p. 109.
2. Sing. S.S. op. cit p. 18
3. Chattopadhyay, B. Coins and Icons, Culcutta 1977. p. 37. Sing S.S. op.cit p. 20
4. Paranavitana Felicitation Volume, 1965 Colombo pp. 227-42
5. Sing S. S. op. cit. p. 19

කව දෙක එකට බැඳී ඇති ස්වරූපයක් ගන්නා අතර ප්‍රතිමුඛයේ ඇති සළකුණෙහි එය එකිනෙකට වෙන් වී ඇත. දේශීය උගතුන් හැම දෙනකු විසින්ම පාහේ මෙම සළකුණ චෛත්‍යය හෝ ස්ථූපය ලෙස සඳහන් කර ඇත. එහෙත් මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියෝ මෙය හින්දූන්ගේ ත්‍රිකූට පර්වතය විය යුතු බව පවසති.1 මෙයින් බුද්ධ පරිනිර්වාණයත් ධාතු නිදන් කිරීම දක්වෙන ස්ථූප සළකුණ බවද අඩකව තුනෙන් අනිච්ච දුක්ඛ අනාත්ම පිළිබිඹු කෙරෙන බවද ඩී. පී. ඊ. හෙට්ටිආරච්චි මහතා අදහස් කරයි.2

එහෙත් මීට ඉහතින් දක්වූ සංකේත හඳුනා ගැනීමේදී අනුගමනය කළාක් මෙන් කාසි නිර්මාණය පිළිබඳව ශ්‍රී ලාංකිකයින් ආභාෂය ලැබූ උතුරු ඉන්දියානු කාසි හා එහි සංකේත පිළිබඳව පිරික්සීමේදී මීට වඩා වෙනස් අදහස් ඉදිරිපත් කළ හැකි වේ. ක්‍රිස්තු පූර්ව තුන්වැනි හෝ හතරවැනි සියවසේ පටන් ශතවර්ෂ කීපයක් දක්වා භාරත යේ භාවිතයේ පැවතිණැයි සැළකෙන කාසිවල මීට ඉහත දී සාකච්ඡා කළ සළකුණු සටහන් වී තිබුණාක් සේම මෙම පර්වත සටහන ද නොවෙනස්වද එමෙන්ම තරමකින් වෙනස් අයුරින්ද සටහන් වී තිබීම දක්නට ලැබේ. සමහර ඉන්දියානු කාසිවල මෙම සළකුණ අඩ කව තුනකින් නොව අඩ කව පහකින් හෝ හතකින් යුතුව දක්නට ලැබේ.3 කුනිඳ හා පංචාල කාසිවල මෙසේ අඩකව වැඩි ප්‍රමාණයක් දක්නට ලැබුණද ධරණ කාසිවල ලැබෙන්නේ අඩ කව තුනකි.4 අනුරපුර මුල් අවදියේදී මෙරට භාවිතයේ පැවති ධර්මචක්‍ර කාසිවල ආරුක්කු තුනකින් හයකින් යුතුව මෙ සළකුණ දක්නට ලැබේ.

ඉන්දියාණු කාසිවල සඳහන් මේ සළකුණ පිළිබඳව මෑත කාලයේදී උගතුන් විසින් දක්වා ඇති අදහස වනුයේ මෙයින් පැරැන්නන්ගේ ආගමික විශ්වාසයට පාත්‍රව තිබූ කඳු හා පර්වත සංකේත කරවන බවකි. ඒ අනුව අඩ කව වලින් ශිඛර හෝ කඳු දක්වේ. භාරතීය කාසි සමහරෙක එවැනි ශිඛර මුදුන්හි ගස් සහ නරියා, බල්ලා, මොනරු ආදී සතුන් දක්නට ලැබේ.5 ඇත්ත වශයෙන්ම මෙය බෞද්ධ ස්ථූපයක් හෝ චෛත්‍යයක් වී නම් ඒ මතුපිට මෙසේ නරින් බල්ලන් සිටීම කිසිසේත් සිදුවිය නොහැක් කකි. තවත් අතකින් බලන විට මෙම කාසි නිර්මාණය කළ කලාකරුවාට එක් අඩ කවයක් හා ඒ මත වූ යූපයකින් චෛත්‍ය සළකුණ චෛත්‍යයක ස්වරූපයෙන්ම පහසුවෙන් සටහන් කිරීමට හැකිකම තිබියදී චෛත්‍යයක් දක්වීමට මෙසේ අඩ කව කිහිපයක් සටහන් කිරීමට අවශ්‍යකමක් වූවාදැයි ප්‍රශ්නයකි.

භාරතීය ධරණ කාසි සමහරෙක මෙම පර්වත හෝ කඳු සළකුණට ඉහළින් අඩසඳ සළකුණ දකින්නට ලැබේ.6 එහෙයින් මෙමගින් ශිව දෙවියාගේ ස්ථිර වාසභවනය වූ හිමාලයෙහි වූ කෛලාස පර්වතය සංකේතවත් කර ඇති බවටද අදහස් ඉදිරිපත් වී ඇත. ශිව කෛලාසපති හා ගිරිස යනුවෙන් හඳුන්වන්නේ මේ හෙයිනි.7 ජේ. එන්. බෙනර්ජි මහතා මීට සමීප අදහසක් දරමින් අඩසඳ ශිවගේ සංකේතයක් බැවින් මෙය ශිවගේ ත්‍රිශෘංග පර්වතය හා ශශාංඛ ශේඛර නිරූපණය කෙරෙන බව පවසයි.8 කඳු වැටි සංකේතවත් කිරීම සඳහා මෙසේ ආරුක්කු යෙදීම පැරණි භාරතයේ පමණක්

---

1. විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ, ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය VIII පිට.
2. Paranavitana Felicitation volume, 1965 pp. 237-38.
3. Sing. S. S. op. cit. pp. 27-28 Plates VII-IX
4. Sing. S. S. oP. cit. plates XVII-XVIII
5. Sing. S. S. op. cit. Plates VII-X, p.27
6. Sing. S. S. op. cit. Plate XI
7. Sing. S. S. op. cit. p. 27
8. Benerji, J. N., The Development of Hindu Iconography, Culcutta, 1966. p. 109 Sing. S. S. op.cit. p. 27

නොව මෙසපොතේමියාව මධ්‍ය ආසියාව සහ චීනයේ පවා අතීතයේ භාවිතාවූ ක්‍රමයක් බව ආනන්ද කුමාරස්වාමි මහතා පැහැදිළි කොට පෙන්වා දී ඇත.1 හින්දු විශ්වාස-යන් අනුව ලෝකයේ මැද හැටියට ඔවුන් පිළිගත් හිමාලය කඳුවැටිය මහමේරු පර්වත යේ පාමුල පිහිටා ඇති අතරම දෙවි දේවතාවුන්ගේ වාසස්ථානයද වේ. තවද ශිව දෙවියා වෛද්‍යනාථ ලෙස හැඳින්වෙන අතර දුර්ලභ ගණයේ ඖෂධ පැලෑටින්ගෙන් යුක්ත හෙයින්ද මෙම කඳුවැටිය හින්දූන්ගේ ගෞරවයට හා පූජනීයත්වයට පත්වූවකි.2 කේ. සී. ආර්යයන් කාසිවල සඳහන් මෙම සළකුණ මහාමේරු පර්වතය බව සළකයි.3 කෙසේ වෙතත් ලංකාවේ කාසිවල ඇති මෙම සළකුණද පර්වත සළකුණක් හැටියට හේරස් පියතුමා විශ්වාස කරයි.

මහින්දගමනයට පෙර අනිකුත් ප්‍රාථමික ශිෂ්ටාචාරයන්හි පැවතුනාක් මෙන් ලාංකිකයයින් අතරද පර්වත ඇදහීමද ප්‍රචලිතව පවතින්නට ඇත. සමනළ කන්ද බෞද්ධයින්ගේ පූජනීයස්ථානයක් බවට පත්වූයේ එම පර්වත වන්දනා කරන්නවුන්ගේ ඒ හුරුව බෞද්ධ ඌරුවනට හැඩගැස්වීම නිසා විය යුතුය. ඒ කෙසේ වෙතත් ලාංකික කාසි වල ඇති මෙම පර්වත සළකුණු ලාංකිකයන්ගේ පැරණි ආගමික විශ්වාසය පිළිබිඹු කිරීම සඳහා සටහන් කරන්නට ඇතැයි සිතනවාට වඩා අපේ පැරණි කාසි නිර්මාණ යේදී සමකාලීන ඉන්දියාණු කාසි අනුකරණය කිරීම නිසා සටහන් කරන ලද ඒවායැයි පිළිගැනීම වඩා උචිතය. මේ අතර කඳු හත මංගල ලකුණක් හැටියටද සැළකුණ බවට සාක්ෂි ඇත.4

## තුන්කොන් සටහන

කාසියේ අභිමුඛයෙහි ඇති තුන්කොන් සටහන කුමන අදහසක් නිරූපනය කිරීම සඳහා යෙදූ සංකේතයක්දැයි වටහා ගැනීම තරමක් අසීරුය. මේ නිසාම වියත්තු මේ සඳහා විවිධ අර්ථකථන දෙති. ජෝන් ස්ටීල් මහතා මෙහි ඇති ත්‍රිකෝණ රූපය හා ඒ මත පිහිටා ඇති කුළුණක සමාන ලකුණ විමසමින් මෙයින් හින්දු භක්තිකයින්ගේ ලිංග පූජාව නිරූපණය වේ යැයි පවසයි. ත්‍රිකෝණයෙන් (ත්‍රිපුර) යෝනියද ස්ථම්භ හෝ දුන්නක සමාන ලකුණින් ශිවද වශයෙන් මෙයින් ශිව හා ශක්ති නිරූපනය වන බවට ද අදහසක් ඇත.5 විමලකිත්ති හිමියෝ මෙයින් චෛත්‍යය අදහස් කෙරෙන බව දක්වති.6 මේ කාසිය පිළිබඳ විස්තර සපයන කොඩ්රින්ටන් මහතා ඒ තුළින් මේ සංකේතය බැහැර කොට ඇත.7

භාරතයේ ක්‍රිස්තුපූර්ව යුගයේ කාසි වලද ලංකාවේ ක්‍රිස්තුපූර්ව යුගයේ බ්‍රාහ්මී සෙල් ලිපිවල ඇති සංකේත අතරද මේ සළකුණ දක්නට ලැබේ. පෙරියපුලියන්කුලම ලිපියේ, පාඨයක ආකාරයට ඇති සංකේත හතරින් අවසානයට යෙදී ඇත්තේ මේ සංකේත යයි.8 මේ සළකුණින් අශෝක අධිරාජයාගෙන් දෙවන පැතිස් රජුට ලැබුණ දෙවන පිය උපාධි නාමය ගම්‍ය වන බවද මෙම සම්පූර්ණ පාඨයම ගමණී අභයතිෂ දෙවන පියලෙස කියවිය

1. Coomaraswamy A. History of Indian and Indonesiea Art; London, 1929 p. 44 Sing. op. cit. p. 27
2. Sing. op. cit. p. 27
3. Aryan. K.C.; Basis of Decorative Eliment in Indian Art. New Delhi 1981. p. 26.
4. Samantakutavannama, ed. W. Dhammanda Thero VV. 765-70.
5. Zimmer H. op. cit. p. 147
6. විමලකිත්ති හිමි මැදඋයන්ගොඩ, ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය VIII පිට
7. Codrington op·cit.
8. Paranavitana, S. Inscriptions of Ceylon. Vol.. I,13970, pl xxxvi, 368

හැකි බවද පී. වීරසිංහ මහතා දක්වයි.[1] මෙරට බ්‍රාහ්මී සෙල්ලිපිවල ඇති බ්‍රාහ්මී නොවන සංකේත අක්ෂර ක්‍රමයක් යැයි පරණවිතාන මහතා පෙන්වා දී ඇතත් මෙම සංකේත යෙන් ''දෙවන පිය'' කියැවෙයැයි යන්නට බාධා වන සාක්ෂිද හමුවේ. පැරණි ඉන්දියානු කාසියක එක් පැත්තක මේ සළකුණද පර්වතය මුවා හා ශිව සංකේත සළකුණක්ද වේ.[2] භාරතීය හස් යෙදු කාසියකද මේ සළකුණද වෘක්ෂය, පර්වතය හා සූර්‍යයාද සටහන් කර ඇත.[3] මෙසේ ඉන්දියානු කාසිවල මේ සළකුණ වෙතත් හින්දු ආගමික සංකේත සමග සටහන් වී තිබීමේදී බෞද්ධ රජෙකු වූ අශෝක අධිරාජයා භාවිතා කළ දෙවන පිය අභිදනය මෙයින් කියවෙයැයි සිතීම අපහසුය. එපමණක් නොව භාරතය පුරා විසිරී ඇති එතුමාගේ සෙල්ලිපි වල වුවද දෙවන පිය හැඟවීමට මෙම සළකුණ යොදා ඇති බවක් සොයාගැනීම අපහසුය. ඉහත කී ඉන්දියානු කාසිවල ඇති ඉතිරි සංකේත සියල්ලක්ම පාහේ ආගමික වටිනාකමකින් යුතු සංකේත හෙයින් ඒ අතර ඇති මෙම සංකේතයද හින්දු ආගමික සංකේතයක් බව පිළිගැනීමට හැකිය.

## එකට බැඳුන තුන් කොන් සටහන් දෙක

මේ කාසියේ ප්‍රතිමුඛයේ සටහන් කර එක් සංකේතයක් උගතුන් විසින් දක්වා ඇත්තේ එකට බැඳුණ තුන් කොන් සටහන් දෙකක් හැටියටය. ඉන්දියාවේ හස්යෙදු කාසිවලද මේ සළකුණ දක්නට ඇත ද ඉන්දියානු කාසි පිළිබඳව කර ඇති අධ්‍යයනයන්හි මේ පිළිබඳව විස්තර දක්වා නැත. එහෙත් පැරණි ඉන්දියාවේ සහ අනුරපුර අවදියේ ශ්‍රී ලංකාවේ සිරිපතුල් ගල්වල ස්වස්තික චක්‍ර චාමර සංඛ ආදී වශයෙන් මංගල වස්තු සඳහන් කිරීමේදී මේ සළකුණද පැහැදිළිව සටහන් කර ඇත. එසේ හෙයින් මෙය මංගල සම්මත ලකුණක් බව පැහැදිළිවම කිව හැකි වුවත් එම ලකුණ හැඳින්වූ නාමය හරිහැටි පැවසීම අපහසුය. මේ පිළිබඳව අදහස් දක්වන ටී. බී. කරුණාරත්න මහතා මෙයින් කුස තණ මිටියක් මැදින් බැද සාදගන්නා ලබන යෝගීන්ගේ බද්‍රාසනය නොහොත් භද්‍ර පීඨය සංකේතවත් කෙරෙන බව දක්වයි.[4] භද්‍ර පීඨයද මංගල ලකුණකි. එහෙත් භද්‍ර පීඨය සැකසුණේ කුස තණ ඇතිරීමෙන් මිස කුසතණ මිටි වශයෙන් බැදී-මෙන්දැයි විමසිය යුතුව ඇත. සොත්ති බමුණා විසින් ආසනයක් සඳහා බුදුන්වහන්සේට වද පූජා කොට ඇත්තේ කුසතණ අට මිටක් මිස මිටි අටක් නොවේ.[5] වත්මන් අවදි යේදී උත්තර භාරතයේ පරිහරණය කෙරෙන ඉහත ලකුණට සමාන හැඩයැති ආසන වර්ගයක් පිළිබඳව දැන ගන්නට ලැබී ඇත.[6] එහෙත් මේ ආසන වර්ගය වුවද වසර දෙදහස් ගණනකට පෙර පැවති ආසනයක හැඩහුරුව ආකාරයට සාදන ලද්දක්දැයි පැහැදිළි කර ගැනීම අපහසුය. අෂ්ට මංගල වස්තු සඳහන් සමහර ඉන්දියානු කැටයම් චිත්‍ර අතර පාද තුනක් සහිතව ඇති ආසනයද භද්‍රාසනය ලෙස ගැනේ. (අංක 4 ඡායා රූපයද බලන්න.)

බුදුන්වහන්සේගේ සිරිපතුලේ වූ මංගල ලක්ෂණ අතර ස්වස්තිකය, සෞවස්තිකය සිරිවසය යනුවෙන් වූ ලක්ෂණ තුනක්ද අපගේ පැරණි මූලාශ්‍රවල එකට සඳහන් වේ.[7] මේ අතරින් ලකුණු දෙකක් පැරණි සිරිපතුල් ගල් පිරික්සීමේදී පහසුවෙන් හඳුනාගත හැකිව ඇත. එනම් ස්වස්තිකය හා විෂ්ණුගේ ළපැත්තේ ඇතැයි සැළකෙන ශ්‍රී වත්ස

1. වීරසිංහ, ජී. නාගයින්ගේ පා සටහන් 1981 කොළඹ 20–26 පිටු.
2. Allan, J. op-cit. p. 159 pl. XXII. 1
3. Sing S. S. op – cit. pl. XII
4. Ancient Ceylon. No. 3. 1979
5. පූජාවලිය, වෙරගොඩ අමරමෝලි සංස්. 1953 කොළඹ, පි. 178.
6. කඹුරුපිටියේ වනරතන නාහිමියන්ගෙන් අසා දැන ගතිමි.
7. ධර්ම ප්‍රදීපිකාව, රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාම සංස්: 1915, 05 පිට බුත්සරණ, වැ. සෝරත හිමි සංස්: 1959, 235 පිට.

සළකුණය. තුන්වැන්න හඳුනා ගැනීම තරමක් අසීරුය. එහෙත් පසුකාලීන සිංහල මූලාශ්‍රවල දෙපසින් විශාලවූත් මැදින් බඳ සිහින් වූත් හේරි විශේෂයක්ද 'සිරිවස' යනුවෙන් හඳුන්වා ඇත. කාන්තාවන්ගේ සිහිනිඟ දක්වීමේදී ඒ සිරිවසට උපමා කොට දක්වා ඇත. ''රන් සිරිවස නිභාය සිහිනිගාය'' යනුවෙන් ගුත්තිලයේද[1] ''සිරිවස සිරිනිගා කළ ලෙළ සිහිනිභා'' යනුවෙන් හංස සංදේශයේද[2] ''විමල් සක් ගිපිදු කුඹු සිරිවස බැබලූ යනුවෙන් සැළලිහිණියේද සිරිවස පිළිබඳව සඳහන් වේ. හැඩය අනුව නම් ඉහත කී සිරිපතුල් ගලෙහි සටහන් සළකුණු මෙම කාව්‍ය ග්‍රන්ථවල සඳහන්ව ඇති සිරිවසට සම්පූර්ණයෙන්ම සමානත්වයක් දරයි. කෙසේ වෙතත් මේ සළකුණ පිළිබඳව මේ දක්වා ඉදිරිපත් වී ඇති අදහස් අතර ටී. බී. කරුණාරත්න මහතාගේ අදහස ප්‍රමුඛස්ථානයෙහිලා පැවතියත් මෙයින් හැඟවෙන්නේ මංගල ලක්ෂණයක් හැටියට සැළකූ හෙරී විශේෂයක්දැයි තවදුරටත් විමසා බැලීම වටී. පළමුවැනි සියවසට අයත් කුෂාණ කැටයමක අෂ්ට මංගල වස්තු දක්වා ඇති අතර එහි ඇති භද්‍රාසනය මේ සළකුණට එක්තරා සමානතත්වයක් දක්වුවද තරමක වෙනසක් පෙනේ.[3]

### නන්දිපාදය හා වෘෂභ හිස

බිංදුවක් හෝ කවයක්ද ඒ මත උඩු අතට ඇති අඩකවයක්කින්ද සෑදී සංකේතයක් මෙම කාසියේ ප්‍රතිමුඛයේ දක්නට ඇත. ගව හිසකට සමාන මෙවැනිම සළකුණු ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රාවලද පුරාණ ඉන්දියාවේ ධරණ කාසිවලද දක්නට ලැබේ.[4] එම කවය ඇතුලෙහි තිතක්ද කවයට පිටින් තිත් දෙකක් හෝ තුනක්ද සහිතව ඇති සළකුණු ද දක්නට ලැබෙන අතර එය ඉහත සංකේතයේ වර්ධනය වූ අවස්ථාවක් සේ පිළිගනී.[5] මෙය බ්‍රාහ්මී ''ම'' අක්ෂරයට සමාන කමක් දරතත් ක්‍රිස්තු පූර්ව යුගයේ මුද්‍රා හා කාසි වල අනිකුත් සංකේත සමඟ සටහන් වී ඇති මෙම සළකුණ බ්‍රාහ්මී අක්ෂරයකට වඩා පැරණි ශිෂ්ටාචාරයන්හි විශ්වාසයට පාත්‍රව තිබූ යම් ආගමික සළකුණක් බව පිළිගැනීම වඩාත් යෝග්‍යය. මේ පිළිබඳව ජෝන් මාර්ෂල් මහතාගේ අදහස වනුයේ එයින් වෘෂභ හිස දැක්වෙන බවය.[5] බී. චටෝපාධ්‍යය මහතා මෙය සශ්‍රීකත්වය පිළිබඳ විශ්වාසයේ සළකුණක් බව සිතන අතර[6] මෙයින් සූර්ය හා චන්ද්‍ර නිරූපණය කෙරෙන බවටද අදහස් ඇත. වජ්‍ර හා අග්නි සමග මෙම සංකේතයේ[7] සම්බන්ධතාවයක් පෙනෙන බව ආනන්ද කුමාරස්වාමි මහතාගේ අදහස වේ. කෙසේ වෙතත් ක්‍රිස්තු පූර්ව යුගයේ උත්තර භාරතීය මුද්‍රා සහ කාසි වල වෘෂභ රූපය සුලභ වශයෙන් දක්නට ලැබෙන අතර සමහර අවස්ථාවල ඛාරොෂ්ටි අක්ෂරයෙන් උසබ පාඨයද සටහන් කර තිබීමෙන් වෘෂභ සංකේතයට විශේෂ ස්ථානයක් හිමිව තිබූ බව පෙනේ. වෘෂභ සංකේතයෙන් ශිව දෙවියා පිළිබඳ සංකල්පය නිරූපණය වන බවට සැකයක් නැත.

### ත්‍රි රත්න

ඇතා සහ ස්වස්තික කාසි සමහරෙක ඉහත කී සළකුණ වෙනුවට දැනට ත්‍රි රත්න යැයි ප්‍රසිද්ධියට පත්ව ඇති සළකුණ සටහන් කර ඇත. (ඡායාරූප 2, 6) මේ සංකේතය පිළිබඳව දැනට උගතුන් විසින් විවිධ අර්ථකථන ඉදිරිපත් කර ඇති අතර නන්දි

---

1. ගුත්තිලය, 395 කවිය.
2. හංස සංදේශය, –132 කවිය, අ. දො. චන්ද්‍රසේකර සංස්: 1964 කොළඹ.
3. Ancient Ceylon No 3. Pl. 1.
4. Sing S. S. – op – cit Plates II-IV
5. Marshall, John, Mohen-jo-daro and the Indus Vally Civilization vol. II, pp. 54-55
6. Chattopadyay B. coins and Icons. Culcutta 1977 p. 57 Sing S. S. op-cit p. 24
7. Coomaraswamy A. K. Eliments of Buddhist Econography. Delhi p. 14

පාදය, ත්‍රිශූලය ත්‍රිරත්නය හා සත්ති යනාදිය ඒ අතර ප්‍රමුඛ වේ.[1] මේ සළකුණ මීට ඉහතදී දැක්වූ වෘෂභ හිසට සමාන සළකුණ වර්ධනය වූ අවස්ථාවක් හැටියට දැනට බොහෝ උගතුන් විසින් විශ්වාස කරනු ලැබේ. උත්තර භාරතීය රිදී ධරණ කාසි සම හරෙහා එම වෘෂභ හිස් ලකුණ අං දෙකක් මෙන්ම තුනක්ද සහිතව දක්නට ලැබෙන අතර වෘෂභ හිස සළකුණ ත්‍රි ශූල සළකුණ දක්වා ක්‍රමයෙන් වැඩීගිය ආකාරයට පැහැදිළි සාධකයක් හැටියට එස්. එස්. සිං මහතා විසින් මෙය පෙන්වා දී ඇත.[2] ත්‍රිශූලය ශිව සංකේත කොට දක්වන ඔහුගේ ආයුධය වේ. වෘෂභ හිසින් ඔහුගේ වාහනය වූ නන්දි නම් වෘෂභයා නිරූපණය විය හැකිය. ක්‍රිස්තු පූර්ව අවදියේ මැටි මුද්‍රාවල මේ සළකුණ පහතින් තිත් තුනකින්ද ඒ මත අං තුනකට සමානාකාරයෙන් යුත් කොටසකින් යුතුව සටහන් වී ඇත.[3] නන්දි නම් වෘෂභයාගේ කුර සළකුණ අර්ථයෙන් නන්දිපාද වශයෙන් ද හඳුන්වයි. පහත ඇති තිත් තුනෙන් මැද තිත කුඩා කවයක් හැටියටද දෙපසින් වූ තිත්දෙක ඊට සම්බන්ධ වූ පෙති හෝ කොළ දෙකක ආකාරයෙන් සැකසුණ බටහිර ඉන්දියාවේ දක්නට ඇති සංකේතයකට යටින් බ්‍රාහ්මී අක්ෂරයෙන් නන්දිපාද යන්න සටහන් කර ඇත.[4] මේ සළකුණ ත්‍රිරත්න, ත්‍රිශූල ලෙස සැළකෙන සළකුණට බොහෝ දුරට සමානය. ත්‍රි රත්න ත්‍රිශූල යැයි සිතන සළකුණ තරමක් විශාල කවයක්ද එහි ඉහළින් දෙපසින් පෙති දෙකකින්ද ඒ මතුපිට වත්මන් ත්‍රිශූලයක උඩ කොටසට සමා- නව දෙපසට නැමී ගිය හා උඩට නෙරාගිය උල් තුනකින් යුක්තය. අපගේ ඇතා සහ ස්වස්තික, එක් කාසියක මේ සළකුණේ උඩ කොටස ගව අං යුවලක් මැද ඇති ත්‍රිකෝණ ලකුණක් ආකාරයෙන් දක්වා ඇත. (ඡායාරූප 2)

කෙසේ වෙතත් ක්‍රිස්තු පූර්ව යුගයේ උතුරු ඉන්දියානු කාසි ගණනාවකම පර්වතයක් හෝ කන්දක් මුදුනේ මේ සළකුණ යොද ඇත්තේ[5] ශිව දැක්වීමට විය යුතුය. නන්දි යන්නෙන් ශිව දෙවියාගේ වාහනය වූ වෘෂභයා හැඳින්වුවද එම ශාන්තුවරයන්ගේ පාදය නන්දිපාද වශයෙන් හැඳින්විය හැකි බව ආනන්ද කුමාරස්වාමී මහතා පෙන්වා දෙයි.[6] පාදුකා යනුවෙන් දැක්වෙන්නේ ද ශිව දෙවියන්ගේ පාද සටහන්ය. මෙසේ ආරම්භක අවදියේදී උතුරු ඉන්දියානු කාසි මුද්‍රා හා අනිකුත් කලා කෘති පරික්ෂා කිරී- මේදී ශිව රූපය සටහන් නොකොට ඔහුගේ වාහනය, ආයුධය වාසස්ථානය, හිසෙහි හෝ නළලෙහි ඇති සළකුණ, හෝ පා සටහන දක්වා ශිව එම ස්ථානයේ වැඩ සිටින බව නරඹන්නාට සිතා ගැනීමට ඉඩ සැළසෙන අයුරු නිර්මාණය කිරීමට එම අවදියේ කලාකරුවා පෙළඹී ඇති බව පෙනේ.

උතුරු ඉන්දියාවේ බෞද්ධ කලාශිල්ප ආරම්භ වෙත්ම මේ ආකාරයෙන්ම බුදුන් වහන්සේ කැටයම් නොකොට ඒය කැටයමෙහි අදළ ස්ථානයෙහි බුදුන් වහන්සේ වැඩ සිටිනා බව පමණක් සිතාගත හැකි පරිදි බෝධිය ආසනය, සිරිපතුල, ආදී තවත් සළකුණු පමණක් දැක්වීමට කලාකරුවා පෙළඹී ඇති බව බාර්හූත් සාංචි ආදී ක්‍රිස්තු පූර්ව යුගයේ කැටයම් වලින් පැහැදිළි වේ. මේ කලා නිර්මාණ කරනු ලැබුයේ හින්දු කලා නිර්මාණ කළ ගුරුකුලයේ කලා කරුවන් විසින්ම විය හැකිය. මෙම බෞද්ධ කැටයම් අතර ඉහත කී ත්‍රිශූල හෝ ත්‍රිරත්න සළකුණ සුලභ වශයෙන් යොදගෙන

---

1. Ancient Ceylon, (JASDSL) No. 3. 1979. pp. 167-182
2. Sing S. S. op-cit p. 24
3. Thaplyal, K. Studies in Ancient Indian seals, Lucknow, 1972 Pl. V. 2
4. Coomarasvamy. op. cit. Fig. A. P. 16.
5. Sing. S. S. op-cit. Plates XVII
6. Coomarasvamy op. cit. p. 16

තිබීම පිළිබඳව උගතුන්ගේ අදහස වී ඇත්තේ හින්දු සංකේතයෙන්ම බෞද්ධ අර්ථ කථනයක් දී භාවිතයට ගෙන ඇති බවය.[1] මෙමගින් බුද්ධ ධම්ම සංඝ යන බෞද්ධ ත්‍රිරත්නය අදහස් කර ඇති බව බොහෝ උගතුන් අදහස වේ.[2] මේ අතර ත්‍රි රත්නය සළකුණ පිළිබඳව ශාස්ත්‍රීය අධ්‍යයනයක් කරන ටී.බී. කරුණාරත්න මහතා මෙය,සත්ති සංකේතය බව දැක්වීමට උත්සාහ ගෙන ඇත.[3] කෙසේ වෙතත් මෙම වැදගත්කම නිසාම මෙය මංගල සළකුණක් හැටියට පිළිගෙන ඇතිබව පැහැදිළි වනුයේ අනුරපුර මුල් අවදියේ හා අමරාවතියේ සිරිපතුල් ගල්වල ඇති මඟුල් ලකුණු අතර සටහන් වී තිබීමෙනි.[4]

මෙහි ඇති උල් තුනෙන් බුද්ධ ධම්ම සංඝ අදහස් කළේ නම් ධම්ම හා සංඝ කෙසේ වෙතත් බුද්ධ සටහන පාදයේ සළකුණු කිරීමට කලාකරුවා පෙළඹේදැයි සැක යකි. සාංචි දොරටුවල බුද්ධ චරිතයේ නොයෙකුත් අවස්ථා කැටයමට නගා අවසානයේ ඒ සියළු කැටයම්වලට ඉහළින් කුළුණු මුදුනේ යොද ඇත්තේ මෙම සළකුණය.[5] ටී. බී. කරුණාරත්න මහතා දක්වන හැටියට මෙය සත්ති සළකුණ නම් සාංචි තොර-ණෙන් මෙතරම් වැදගත් තැනක් එයට ලබා දුන්නේ කුමක් හෙයින්ද යන ප්‍රශ්නය මතු වේ.

යම් යම් රූප හෝ සංකේත කැටයමට හෝ චිත්‍රයට නැගීමේදී විවිධ කලාකරු-වන් අතින් පහසුවෙන් සටහන් කිරීමට යාම නිසා හෝ අලංකාර යෙදීම නිසා එකිනෙකට වෙනස් හෝ මුල් අදහසට වඩා වෙනස් අදහසක් ඇතිවන ආකාරයට සිය නිර්මාණයන් කෙරෙන අවස්ථා ඇත. උදාහරණයක් හැටියට අමරාවතී සිරිපතුල් ගල්වල ස්වස්තිකය මෙසේ සිව් ආකාරයකට සටහන් කර තිබීම දැක්විය හැකිය.[6] සාංචි කැටයම්වල බුද්ධ චරිතය කැටයමට නගා ඇති සෑම ස්ථානයකම බුදුන්වහන්සේ සිටිය යුතු තැන හිස්ව තබා ඒ වටා ඇති සංකේත වලින් එතැන බුදුන් වහන්සේ වැඩ සිටින බව සිතා ගැනීමට ඉඩහැර ඇත. නේරංජනා ගඟින් එතරවන බව දැක්වෙන කැටයමේ සිරිපතුල් දෙකක් සටහන් කර ඇත.[7]

තවත් කැටයමක බෝධිය සහ ඒ යට සිංහාසනයට සමාන ආසනයක් ද දෙපසින් වඳිමින් සිටින බැතිමතුන්ද දක්වේ. මෙම ආසනයේ පාද අඳුන් ගන්නා කොටස පිට තබන හා අත් තබන ඇඳි දක්නට ලැබේ. එම ආසනය මතුපිට බුදුන් වහන්සේ වැඩ සිටින බව සිතා ගත හැකිය. බෝධිය යට බුදුන් වහන්සේ වැඩසිටි ආසනය බෝධි මණ්ඩ යනුවෙන් හැඳින්වේ. මේ අතර තවත් කැටයම් කීපයක බෝධිය ද ඊට පහළින් ඇති මල් ආසනයක්ද දෙපසින් වඳිමින් සිටින බැතිමතුන්ද වේ. (ඡායාරූප 3, 4)

බෝධිය යට මල් ආසනයට ඉහළින් ඇති ත්‍රිරත්න සළකුණට සමාන සළකුණ කලාකරුවා අතින් සුළු වෙනස්කම්වලට භාජනය වූ මීට ඉහතදී දැක්වූ කැටයමේ ඇති ආකාරයට වූ ආසනයක් බව විමසිල්ලෙන් බැලූ කල්හි සිතිය හැකිය. එහි ඉඳගන්නා කොටස පැහැදිළිව දක්වේ. ත්‍රිරත්න සළකුණේ පෙති දෙකක් ආකාරයට පසෙකට

1. Zimmer H. The Art of Indian Asia. Vol. I. P. 27
2. Ancient Ceylon, No. 3, 1979. p. 167. Zimmer. H. op. cit p. 27
3. Karunaratna T. B. "A New Interpretation of the Buddhist Triratna Symbol'. Ancient Ceylon No. 3. 1979 pp. 167-82.
4. Ancient Ceylon No. 3. p. 189
5. Zimmer H. op. cit vol. II. Plate
6. Ancient Ceylon No. 3. 1979. p. 189.
7. Zimmer op. cit II Plate. 94

විහිදී ඇත්තේ එය බව පෙනේ. එම ආසනය පැනවී ඇත්තේ නෙළුම් මලක් මත බව පහතින් ඇති කවය නෙළුම් මල් කැටයම යොද තිබීමෙන් පෙනේ. ඉහළින් දක්-වෙන්නේ පිට තබන කොටස බව අනුමාන කළහොත් කොටස් දෙකකින් සමන්විත ආසනයක් බව සිතිය හැක. ආසනයට ඉහළින් ඡත්‍රය තිබීමෙන්ද මේ ආසනය මත බුදුන් වහන්සේ වැඩ සිටින බව සිතා ගැනීමට පුළුවන. ඡත්‍රය පැතලි ආකාරයකට කැටයම් කළ කල්හි ආසනයක ස්වරූපය නරඹන්නාට අමතක වී යා හැකිය. මෙම සිද්ධස්ථානයේ කැටයම් අතර මෙවැනි කැටයම් කීපයක්ම දක්නට ලැබේ. කැටයමේ මේ සඳහන් වන්නේ බුදුන් වහන්සේ බෝමැඩ යට වැඩසිටි ආසනය හෝ පීඨය නම් සාංචි තොරණේ මුදුනට එම කැටයම යෙදීමේ තේරුමක්ද වේ.

කෙසේ වෙතත් හින්දු කලාකෘතිවල මෙම සළකුණින් ශිව දෙවියන් සංකේත කොට දක්වූ බවට සැකයක් නැති අතර බෞද්ධ කලා ශිල්ප වලදී බුදුන්වහන්සේ වැඩ සිටින බව පෙන්වීමට මේ සළකුණ යොදන්නට ඇත. ඇතා සහ ස්වස්තික කාසි වල මෙම සළකුණේ මුල් අවස්ථාව මෙන්ම ත්‍රිරත්න සළකුණ හැටියට වර්ධනය වූ අවස්ථාව දක්වා වූ විවිධ අවස්ථා දක්නට ලැබේ. (ඡායාරූප 2, 5, 6) අවස්ථා කීපය කදීම මුද්‍රණය වූ බවට සාක්ෂි ඇති මෙම කාසි වර්ගයෙන් ප්‍රථමයෙන් මුද්‍රණය වන්නට ඇත්තේ සමහරවිට වෘෂභ හිසට සමානාකාරයෙන් මේ සළකුණ ඇති කාසිය විය යුතුය. (ඡායාරූප 5) පසුව ත්‍රිරත්න ත්‍රිශූල ස්වරූපයට මෙම සළකුණ වර්ධනය වී ගිය අවස්ථා වලදී මුද්‍රණය වූ කාසිවල ඒ එසේ වර්ධනයට පත් වූ සළකුණ යොදන්නට ඇත.

**තිත් තුන**

කාසියේ අභිමුඛයේ මෙන්ම ප්‍රතිමුඛයේද තිත් තුන සළකුණ කිහිපවරක්ම සටහන් කර ඇතද, කාසිය පිළිබඳව අධ්‍යයනය කළ උගතුන් ඒ පිළිබඳ වැඩි අවධාන-යක්යොමු කර ඇති බව නොපෙනේ. මේ තිත් සළකුණු හිස්තැන් පිරවීම සඳහා යොදනු ලැබූ ඒවා යැයි සාමාන්‍ය අදහසක් පැවතුනද මේ ආකාරයටම තිත් තුන සළකුණ යෙදීම ශ්‍රී ලංකාවේ මීට පසු භාවිතයේ පැවති යැයි සැළකෙන කේශර රහිත සිංහ කාසියේ ප්‍රතිමුඛයේද ගව වර්ගයේ කාසියේද[1] 'ද්‍රවිඩ' පාලකයන්ගේ සේතු කාසිවලද[2] පමණක් නොව උතුරු ඉන්දියානු කාසිවලද දක්නට ලැබෙන හෙයින්[3] මෙය හිස්තැන් පිරවීම සඳහා යෙදුවක් යැයි සිතීමෙන් සෑහීමකට පත්විය නොහැකිය.

අනුරපුර යුගයේ භාවිතයේ පැවති රන් කහවනුවේ තිත් හෝ බිංදු සළකුණු යෙදීම කාසියේ වටිනාකම් හැඟවීමේ අරමුණින් කරන ලද්දක් බව පරණවිතාන මහතා ගේ අදහස වේ.[4] ඒ අනුව මේ කරන ලද්දක්දැයි සිතීමට ඉඩ ඇත. අපේ පැරණි සෙල් ලිපිවල ''කහවන'' යන්න සඳහන් තැන්හි කොටස් සතරකට බෙදූ කොටුවක්ද එම කොටු මැද තිතක්ද සඳහන් කර තිබේ. මෙහි තිතක් සඳහන් වූ එක් කොටුවකින් 1/4 හෙවත් පාදයක්ද කොටස් සතරක්ම කළඳක බරින් යුත් කහවන ද අදහස් කර ඇත. කොඩ්රින්ටන් මහතා දක්වූ ආකාරයට ඇතා සහ ස්වස්තික කාසිය කලං තුනකින්යුත් පැරණි හුණ වූයේ නම් ඉහත කී කොටු හෝ තිත් සළකුණු දෙළසක් ඒ සඳහා ලකුණු කළ යුතුව ඇත. එහෙත් මේ තිත් සළකුණ තිත් තුනේ කාණ්ඩ වශයෙන් සටහන් කර තිබෙන ආකාරයද ප්‍රමාණයෙන් හා බරින් මීට වඩා කුඩා වූ සේතු කාසියේ ද මේ ආකාර

---

1. Codrington H. W. op. cit. pl. II
2. bid Pl. IV. 91, 93
3. Sing. S. S. op.cit Plates IV-VI
4. Ancient Ceylon No.3, 1979, pp.

යටම තිත් තුනේ කාණ්ඩ සතරක් ලකුණු කර තිබීමද, කේශර සහිත සිංහ කාසියේ හා ක්‍රිස්තු පූර්ව යුගයේ උතුරු ඉන්දියානු කාසිවල තිත් තුනේ සළකුණ සටහන් කර තිබෙන ආකාරය සැළකිල්ලට ගන්නා කල්හි මෙම තිත් තුනේ සළකුණ කාසියේ වටිනාකම හැඟවීමට වඩා එහි සඳහන් අනිකුත් සංකේත හා සමාන සංකේතයක් සටහන් කර ඇති බව පිළිගැනීම යෝග්‍ය බව පෙනේ.

වෘෂභ හා කුවේර රූපය සහිත ද්‍රවිඩ පාලකයාගේ සේතු කාසියේ සටහන් වී ඇති ආකාරයට මෙය ස්ථිර වශයෙන්ම හින්දු ආගමික සංකේතයක් බව සිතිය හැකිය. මෙම තිත් තුනේ සළකුණ ඉන්ද්‍රගේ භාර්යාව වූ ඉන්ද්‍රාණී දක්වීමක් යැයි කේ. සී. ආර්යන් මහතා අදහස් කරතත්[1] එය එකහෙළා පිළිගැනීමට තරම් අවශ්‍ය සාක්ෂි නැත. එසේ හෙයින් මේ සළකුණ සම්බන්ධව අනුමාන වශයෙන් හෝ අපගේ අවධානයද යොමු කළ යුතු අංග පිළිබඳවද විමසිලිමත් විය යුතුය. ශිවගේ ත්‍රි මූර්තිය එයින් එකකි. ත්‍රි කෝණ සළකුණෙන් හැඳෙන හින්දු විශ්වාසයෙහි ඇති ශ්‍රී යන්ත්‍රය තවෙකකි.[2] අනෙක ත්‍රි පුර සුන්දරී වශයෙන් දක්විය හැකිය.[3] හින්දු විශ්වාසයෙහි ඇති ත්‍රිපුර සුන්දරී ශ්‍රී ලක්ෂ්මී වීමටද ඉඩ ඇත. ශ්‍රී ලක්ෂ්මී ධනයට මෙන්ම සම්පත් ලබාදීමට අධිපතිනිය වන හෙයින්[4] ඇතා හා ස්වස්තික කාසිය භාවිතයේ පැවැති අවදියේම වෙනත් කාසිවල ඇයගේ රූපය සටහන් කර ඇත. එසේ හෙයින් සම්පත් ලබාදෙන මංගල ලක්ෂණයක් හැටියට මෙම සළකුණ කාසිවල සටහන් කරන්නට ඇත.

**මුද්‍රණයේ ඇති වෙනස්කම්**

මෙම කාසියේ දක්වෙන සංකේත හා රූප සටහන්වල සුළු වශයෙන් හෝ වෙනස්කම් රාශියක් දක්නට ලැබීමෙන් සිංහල තඹ මස්ස මෙන්ම මෙම කාසියද අවස්ථා කීපයකදීම මුද්‍රණය වී ඇති බව පැහැදිලි වේ. මෙම වෙනස්කම් අතර කැපී පෙනෙන්නක් නම් එක් කාසියක අභිමුඛයේ මෙන්ම ප්‍රතිමුඛයේද ඇත් රූපය දක්නට ලැබීමය. (ඡායාරූප 6) එසේම සමහර කාසිවල ඇත් රූපය ස්වාභාවික ස්වරූපයෙන් දක්වා ඇති අතර සමහරෙක කලාත්මක ශෛලියකින් අඟපසඟ වෙන් වෙන් කොට දක්වා ඇත. (ඡායාරූප 2, 6) නන්දිපාද හෝ ත්‍රිරත්න සළකුණසේ පිළිගත් සංකේතයද සුළු හෝ වෙනස්කම් කිහිපයකින් යුතුව මුද්‍රණය කළ කාසි හමුවේ. ටී. බී. කරුණාරත්න මහතා බද්‍රපීඨය ලෙස දක්වූ එකට බැඳුණු ත්‍රිකෝණ සළකුණු දෙකක සංකේතයද විවිධ වෙනස්කම් වලින් යුතු මුද්‍රණ හමුවේ.. සමහර කාසිවල අංකුස හා ශ්‍රීවත්ස සළකුණු ඇතද සමහර කාසිවල එය දක්නට ඇත. කාසිය වටා ඇති රේඛාවේද එවැනි වෙනස්කම් දක්නට ලැබේ. ප්‍රධාන වශයෙන් ඇති මේ වෙනස්කම් මෙම කාසිය අවස්ථා ගණනාවකදීම මුද්‍රණය වූ බවට ඇති පැහැදිලි සාධකයෝය. මේ හැර අභයගිරි ත්‍රිකෝණ ව්‍යාපෘතිය මගින් පසුගිය වසරේදී මෙම කාසි වර්ගයේ ඇති ස්වස්තික ලකුණු ඇති මැටි මුද්‍රාවක්ද සොයා ගෙන ඇත. (විෂ්කම්භය සෙ.මී. 3.72 වන මෙය S 12 W 20 9 (15) කැණීම් වලෙන් ලැබුණකි.) කාසිවලට සමාන මැටි මුද්‍රා නිකුත් කිරීම ක්‍රිස්තු පූර්ව යුගයේ සිටම උත්තර භාරතීය වෙළඳ ශ්‍රේණි අතර මෙන්ම පාලකයන් අතරද ප්‍රචලිතව පැවති සිරිතකි.[5]

---

1. Aryan K. C., Basets of Decorative Element in Indian Art, New Delhi, 1981. p. 16
2. Z mmer H. Myths and Symbols in Indian Art and Civilization 1974, : Pl 36;
3. Z mmer, H. op. cit, pp. 190-91
4. Sivaramamurti, C , Sri Lakshmi. P. 28, 33
5. Thaplyal, op. cit ch. III, V

උත්තර භාරතීය මෞර්‍ය සංස්කෘතිය ශ්‍රී ලාංකික සමාජය කෙරේ විශාල බලපෑමක් ඇති කරනු ලැබුයේ දෙවනපෑතිස් අවදියේදීය. මේ සියල්ල සිදුවූයේ මහින්දගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් බව වාර්තා කරන්නේ මහින්දගමනය හුවා දක්වෙන බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් රචිත ග්‍රන්ථවලය. ලෝක ඉතිහාසයේ සාක්ෂි අනුව හැම විටම නව ප්‍රදේශයන් පළමුවෙන්ම සොයාගෙන ඇත්තේ වෙළඳුන්ය. ඔවුනට එම ප්‍රදේශ හුරු පුරුදු වී සම්බන්ධතා වර්ධනය වූ කල්හි ඔවුන් ගිය මාර්ග ඔස්සේ පූජක පන්තිය හෝ වෙනත් පන්තිවල ජන කොටස් ඒ ප්‍රදේශවලට ගොස් ක්‍රියාකාරී වී ඇත. මිහිඳු මාහිමියන්ට මෙරටට පැමිණීමට අනුබලයක් වන්ට ඇත්තේද දෙවනපෑතිස් අවදිය වනවිට උත්තර භාරතය හා අනුරපුර නගරය අතර වූ වාණිජ සම්බන්ධතා විය යුතුය. දැනට අනුරපුර ප්‍රදේශයේ කැරෙන පුරාවිද්‍යා කැණීම්වලින් ලැබෙන මැටි කැබිලිති හා අනිකුත් නශ්ටාවශිෂ්ට විද්‍යාත්මක පර්යේෂණයන්ට භාජනය කළ කල්හි ඉදිරියේදී මේ බව ස්ථුට කරගැනීම අපහසු නොවෙනු ඇත. දෙවන පෑතිස් අවදියේදී දියුණුවට පවත් තිබූ වෙළඳාමකදී මෙරට සිටි වෙළඳ ශ්‍රෙණීන් විසින් හෝ පාලකයන් විසින් උතුරු ඉන්දියාණු කාසි අනුකරණය කරමින් ඇතා හා ස්වස්තික කාසි හා මුද්‍රා නිකුත් කිරීම ආරම්භ කරන්නට ඇතැයි අනුමාන කළ හැකිය.